

සන්න සහිත

# වුත්තෝදය

# VUTTODAYA

WITH

A SINHALESE TRANSLATION

REVISED AND COMPILED BY

Rev: M. Wimalajoti Thero

of Sri Kalyaniwansikarama of Wennawatta

A PUPIL OF THE LATE

Most Venerable Tripitakawagisvaracharya

Sri Sumangala Maha Nayaka Thero

Principal of Viddyodaya Oriental College

PRINTED BY

W, D. Simion Appuhamy.

*at the Vidyaloka Press Buthgamuwa.*

*SECOND EDITION,*

1915

සන්නසහිත

# වුත්තෝදය.

මෙම ඡන්දෝග්‍රන්ථය මීට හවුරුදු (800) අටසියයකින් පමණ පෙර මෙම ලක්දිව විසූ **සඞ්ඝරක්ඛිත** නම් මහාස්ථවිර කෙනෙකුන් විසින් ලෞකිකච්ඡන්දශ්ශාස්ත්‍රාවබෝධය පිණිස පාළිභාෂාවෙන් රචනාකරණලද්දකි.

මුන්වහන්සේ "සම්බන්ධචින්තා, සුබෝධාලඞ්කාර, ඛුද්දසිකාටීකා" මොග්ගල්ලායන ව්‍යාකරණයට අයිති "සුසද්දසිද්ධි" යනාදි ග්‍රන්ථයන් කළ ගරුභාවනීය පණ්ඩිතෝත්තමයෙකි.

පිඞ්ගලමුනි ආදී ආචාර්‍ය්‍යවරයන් විසින් පූර්වයෙහි යම් ඡන්දශ්ශාස්ත්‍රයෙක් කියනලද්ද ඒ සුද්ධමාගධිකයන්ට ඡන්දශ්ශාස්ත්‍රයාගේ පරිඥානය සිද්ධ නොකෙරේ–එහෙයින් මාත්‍රාභේද වර්ණභේද ඇති ලක්ෂ්‍ය ලක්ෂණ දෙකින් යුක්තවූ ප්‍රසන්නවූ අර්ථභා පදක්‍රමඇති වෛදිකච්ඡන්දසින් අන්‍යවූ ලෞකිකච්ඡන්දස ආශ්‍රයකළාවූ මෙම ග්‍රන්ථය ඒ ශුද්ධමාගධිකයන්ගේ සුඛාවබෝධය පිණිස යථෝක්ත පිඞ්ගලමුනි ආදීන් විසින් කථිත ඡන්දශ්ශාස්ත්‍රානුසාරිව කළබව තමන් වාක්‍යවලින් ප්‍රකාශවේ.

එහෙයින් මෙම ග්‍රන්ථය පාලිභාෂෝද්ග්‍රහණය කරණ ආධුනික යන්ට ඡන්දශ්ශාස්ත්‍රාවබෝධය පිණිස අත්‍යන්තෝපකාරිවේ.

මෙහි සන්නකර්තෘ කිකලෙක විසූ කිනම් ඇත්තෙක් දැයි දැන ගැණීමට ඇදහියයුතු කරුණු නොපෙණේ–එතකුදු උවත් ප්‍රශස්ත උගතෙක් බව අවශ්‍යයෙන්ම කියයුතුයි.

මෙම සන්නය අනෙකඋදාහරණ දක්වමින් අතිවිස්තරවශයෙන් කරතිබේ–ඇරත් ප්‍රස්තාරාදි ෂට් ප්‍රත්‍යය ආධුනිකයන්ට සුඛාවබෝධ වන පරිද්දෙන් අතිවිස්තර භාවසන්නයකින්ද සනුමතර තිබේ.

ගල්වාණේ විහාරාධිපතිව වැඩවිසූ මුල්ලෙරියාවේ **සිරිනිවාස** මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය **ශ්‍රීසුමඞ්ගලාභිධාන** ප්‍රධාන නායක ස්ථවිර ස්වාමිපාදයානන්වහන්සේ වෙත ශාස්ත්‍රාගම පුහුණුකළ වෙන්නාවත්තේ ශ්‍රීකල්‍යාණිවංශිකාරාමාධිවාසී මුල්ලෙරියාවේ **විමලජෝති** ස්ථවිර නැමැති මාවිසින් ආධුනිකයන්ගේ සුඛාවබෝධය සඳහා ටීකායෙහි ආ ඇතැම් පාඨද ස්ථානස්ථානයෙහි බහා කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේහි උපප්‍රධානාචාර්‍ය්‍ය හිහල්පොල **දේවරක්ඛිත** යතිතුමන්ගෙන්ද ලබනලද ආධාරත් ඇතුව දෙවෙනිවරට ශුද්ධකොට සකස්කරණලදි.

*M, Wimalajoti.*

### සන්නසහිත

# වුත්තෝදය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

**1 නමත්‍ථු ජනසන්තාන තමසන්තානභෙදිනො**
**ධම්මුජ්ජලන්තරුචිනො මුනින්දොදතරොචිනො.**

**2 පිඞ්ගලාචරියාදීහි ඡන්දං යමුදිතං පුරා**
**සුද්ධමාගධිකානං තං න සාධෙති යථිච්ඡිතං.**

**3 තතො මාගධභාසාය මත්තාවණ්ණවිභෙදනං**
**ලක්ඛ a ලක්ඛණසංයුත්තං පසන්නත්‍ථපදක්කමං.**

---

ශාස්ත්‍රාදියෙහි සදුවාරාන්තුරක්‍ෂණාදිය පිණිස "නමත්‍ථු" යනාදි ගාථාවෙන් ඉෂ්ටදෙවතා නමස්කාරය ආරබ්ධයි.

1. ජන සන්තාන, ජනසමූහයාගේ; තමසන්තාන, අන්ධකාර ප්‍රබන්ධය (ද්වේෂෝ නොහොත්) මොහාන්ධකාරප්‍රබන්ධය; භෙදිනො, බිඳිනා සුළුවූ; ධම්ම, සපර්‍ය්‍යාප්තිකනවලොකොත්තර සද්ධර්මය වැනිවූ නොහොත් සද්ධර්ම නැමැති; උජ්ජලන්ත, දිලියෙන්නාවූ; රුචිනො, සොභාඇති; මුනින්ද, සර්වඥනමැති; ඔදතරොචිනො, චන්ද්‍රයාහට නමත්‍ථු, නමස්කාරවේවා.

දැන් ශාස්ත්‍රාන්තර ඇතිවද වෘත්තොදයාරම්භයෙහි ප්‍රයොජනාදිය දක්වනු පිණිස "පිඞ්ගලාචරියාදීහි" යනාදිවූ "තෙසං සුබිබුද්ධියා" යනු කෙළවර කොට ඇති ගාථා ආරබ්ධයි b

2 පිඞ්ගලාචරියාදීහි, පිඞ්ගලමුනි ආදීන් විසින්; පුරා, පූර්වයෙහි; යං ඡන්දං, යම්ඡන්දශශාස්ත්‍රයක්; උදිතං, කියන ලදද; තං, එය; සුද්ධමාගධිකානං, ශුද්ධමාගධිකයන්ට; යථිච්ඡිතං, යථෙප්සිතය; හෙවත් ඡන්දශශාස්ත්‍රයාගේ පරිඥනය; යතො, යම්හෙයකින්; නසාධෙති, සිද්ධ නොකෙරේද,

3 තතො, එහෙයින්; මත්තාවණ්ණවිභෙදනං, මාත්‍රාභෙද වර්ණභෙද ඇති; ලක්ඛ ලක්ඛණ සංයුත්තං, ලක්‍ෂ්‍ය ලක්‍ෂණ දෙකින් යුක්තවූ; පසන්නත්‍ථපදක්කමං, ප්‍රසන්නවූ අර්ථඇති පදක්‍රමඇති; හෙවත් ප්‍රසන්නවූ අර්ථහා පදක්‍රම ඇති.

"මාගධභාසාය" යනු "ආරභිස්සං" යනුහා සම්බන්ධයි.

---

a ලක්ෂ්‍ය–සමහර

b ආරම්භයි–සමහර

**4 ඉදං වුත්තොදයං නාම ලොකියච්ඡන්දනිස්සිතං**
**ආරභිස්සමහං දානි තෙසං සුඛවිබුද්ධියා.**

**5 සබ්බගලා මනාදිගලහු භයා මජ්ඣන්තගරූ ජසා**
**මජ්ඣන්තලා රතොනට්ඨගණා ගො ගරු ලො ලහු**

**6 භජසා සබ්බගලහු පඤ්චිමෙ සණ්ණිසිතා ගණා**
**අරියාදිම්හි විඤ්ඤෙය්‍යා ගණො ඉධ චතුක්කලො.**

---

4 ලොකියච්ඡන්දනිස්සිතං, වෛදිකච්ඡන්දසින් අන්‍යවූ ලොකිකච්ඡන්දස ආශ්‍රයකළාවූ; වුත්තොදයංනාම, වෘත්තොදයනම්වූ; ඉදං, මේ ඡන්දශ්ශාස්ත්‍රය; තෙසං, ඒ මාගධිකයන්ගේ; සුඛවිබුද්ධියා, සුඛාවබොධය පිණිස; ඉදානි, දැන්; අහං, මම; මාගධ භාෂාය, මාගධ භාෂාවෙන්; ආරභිස්සං, කියම්; හෙවත් අන්තස්ථානයෙන් නිෂ්පන්නවූ බහිස්ථානයෙන් රචනා කෙරෙම්.

මෙහි "මත්තාවණ්ණවිභෙදනං" යන්නෙන් සියලු ඡන්දස් මාත්‍රාවෘත්තවර්ණවෘත්තයයි දෙකක්වනබව කීහ.

"ලක්ඛ ලක්ඛණ සංයුත්තං" යන්නෙන් යම්ලක්ෂණයෙක් යමකින් කිවහොත් ලක්ෂ්‍යයත් එහිම පැණෙනබව කීහු.

5 සබ්බගලා, සර්වගුරු සර්වලඝුන් ඇති ගණයෝ; මනා, මගණ නගණයෝනම්වෙති (මනා) ආදිගලහු, ආදි ගුරුආදි ලඝුන් ඇති ගණයෝ; භයා, භගණ යගණයෝ නම්වෙති (භයා) මජ්ඣන්ත ගරු, මධ්‍යගුරු අන්තගුරුන් ඇති ගණයෝ; ජසා, ජගණ සගණයෝ නම් වෙති (ජසා) මජ්ඣන්තලා, මධ්‍යලඝු අන්තලඝුන් ඇති ගණයෝ; රතා, රගණ තගණයෝ නම් වෙති (රතා) ඉති, මෙසේ; (මේ ඡන්දශ්ශාස්ත්‍රයෙහි) අට්ඨගණා, (වර්ණවෘත්තයෙහි) ගණයෝ අට දෙනෙකි; ගරු, ගුරුඅක්ෂරය; ගො, ගනම්වෙයි; ලහු, ලඝුඅක්ෂරය; ලො, ලනම්වෙයි.

මෙහි ආදිමධ්‍යාන්තගුරුලඝුන්ගෙන් ගුරුලඝු ව්‍යවස්ථාකොලෙන් ගණයෙක්නාම් ත්‍ර්‍යක්ෂර පරිමිතයයි හැඟේ.

6 භජසා, භගණ ජගණ සගණයෝ තුන්දෙනාය; සබ්බගලහු, සර්වගුරුගණ සර්වලඝුගණ දෙදෙනාය යන; ඉමෙ පඤ්චගණා, මේ ගණයෝ පස්දෙන; අරියාදිම්හි, ආර්‍ය්‍යාදි මාත්‍රාවෘත්තයෙහි; සණ්ණිසිතා, සිටියාහුයයි; විඤ්ඤෙය්‍යා, දතයුත්තාහ; ඉධ, මේ මාත්‍රාවෘත්තයෙහි; ගණො, ගණයෙක්; චතුක්කලො, සතර කලාවක් ඇත්තේයි.

මෙහි සර්වගුරුගණනම් ද්විගුරු ගණයයි–සර්වලඝුගණනම් ලඝුසතරක් ඇති ගණයයි.

**7 සංයොගාදී ච දීඝො ච නිග්ගහීතපරො ච යො**
**ගරු වඞ්කො පදන්තො වා රස්සොඤ්ඤො මත්තිකො ලුජු**

**8 පරෙපාදාදි සංයොගෙ යො පුබ්බො ගරුවක්ඛරො**
**ලහු ක්වචි විඤ්ඤෙය්‍යො තදුදාහරණං යථා**

---

7. සංයොගාදිච, සංයොගයහට ආදිවූ යම්ලඝුවෙක් ඇද්ද; දීඝොච, දීඝීවූ යමක් ඇද්ද; නිග්ගහීත පරො ච යො, නිග්ගහීතයා පරකොට ඇති යම් ලඝුවෙක් ඇද්ද; සො, හෙතෙම; ගරු, ගුරුනම් වෙයි; වඞ්කො, රේඛාහෙයින් ⌒ වක්‍රවෙයි; පදන්තො, පාදාන්තයෙහි ලඝුතෙම; වා, ඉෂ්ටපරිද්දෙන් ගුරුවේ ɑ ; රස්සොඤ්ඤො, අන්‍යවූහ්‍ර ස්වතෙම; මත්තිකො, මාත්‍රාවක් ඇත්තේ; ල, ලඝුය; උජු; රේඛාහෙයින්–ඍජු යි.

මෙහි ලඝුහට එකමාත්‍රාව කීමෙන් ගුරු මාත්‍රාවයක් ඇත්තේයයි හැගේ.

8. පාදාදිසංයොගෙ, (මාත්‍රාවෘත්තයෙහි) ගාථා පාදයාගේ ආදිසංයොගයා; පරෙ, පරකල්හි; පුබ්බො, ඒසංයොගයහට පූර්වවූ; යො ගරුවක්ඛරො, (සංයොගාදිහෙයින් ගුරුසංඥලද) යම්ගුරු අක්ෂරයෙක් ඇද්ද; සො, හෙතෙම; ක්වචි, කිසිතැනෙක්හි; ලහු විඤ්ඤෙය්‍යො, ලඝු වූයේයයි දතයුතු; තදුදාහරණං, ඒ ගුරුඅක්ෂරය ලඝුවූතැනට උදාහරණ; යථා, මෙසේයි. "දස්සනෙත්‍යාදි"

මතුකියන ආර්‍ය්‍යා ලක්ෂණය මෙසේකල්හි සමවනහෙයින් ගුරුහට ලඝුවිධාන කළහයි දතයුතු.

---

ɑ ටීකායෙහි

පාදන්තෙ වත්තමානො; ලො යුත්තට්ඨානෙ ගො භවති–විකප්පෙන ⌒ වඞ්කො.

මනො පුබ්බඞ්ගමා ධම්මා
මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන
භාසති වා කරොති වා

එත්ථ–තතිය පාදන්තෙ "න" කාරො ගුරුසඤ්ඤො භවති.

**9 දස්සනරසානුභවනෙ නිබද්ධගෙධා ජිනස්සයං ජනතා
විම්හය ජනනි සන්දන ක්‍රියානු කානනානු රජ්ජති.**

**10 විඤ්ඤෙය්‍යා ලොකතො සඞ්ඛ්‍යා සමුද්දො සු රසාදිනං
පාදෙ ඤෙය්‍යො චතුත්ථංසො පදච්ඡෙදො යතිබ්භවෙ.**

---

9. ජිනස්ස, සර්වඥයාගේ; දස්සනරසානුභවනෙ, දර්ශන රසාස්වාදයෙහි; අයං ජනතා, මේ ජනසමූහයා; නිබද්ධ ගෙධා, බඳනාලද ලොභ ඇත්තියහ; (ඒ එසේමැයි) විම්හය ජනනි, දුටුවන්ට විස්මය උපදවන්නාවූ; සන්දනක්‍රියා, සන්දනක්‍රියාතොමෝ; කානනු, කවර නම් ජනයක්හු; නානුරඤ්ජයති, නො අලවාද; අලවන්නිමැයි.

මේ පථ්‍යාර්‍ය්‍යායෙහි “ක්‍රියානු කානනානු රඤ්ජයති” යන පදයාගේ “ක්‍රියා” යන සංයොගයහට පූර්වවූ තකාරස්ථ අකාර උදාහරණයි.

10. සමුද්දො සු රසාදිනං, සමුද්‍ර ශර රස යනාදීන්ට, සඞ්ඛ්‍යා සංඛ්‍යාතොමෝ; ලොකතො; ලොකයාකෙරෙන්; විඤ්ඤෙය්‍යා, දතයුතුනීයි; (ලොකයෙහි සමුද්‍ර සතරෙක ශර පසෙකැයි කියා ප්‍රසිද්ධය රස සයෙකැයිකියාත් ප්‍රසිද්ධයි, ආදිශබ්දයෙන් චන්ද්‍ර ලොකාදිය ගෘහීතයි-චන්ද්‍ර එකයි-ලොක තුනයි) චතුත්ථංසො, චතුර්ථාංශය; පාදෙ ඤෙය්‍යො, පාදයෙකැයි දතයුත්තේයි; පදච්ඡෙදො, පදසිඳීම; යති භවෙ, යතිනම්වේ.

මෙහි යතිවිභාග මෙසේ දතයුතු.

යති සබ්බත්ථ පාදන්තෙ වුත්තඩ්ඪෙ ච විසෙසතො
පුබ්බාපරා නෙකවණ්ණා පදමජ්ඣෙපි සා ක්වචි
සරො සන්ධිම්හි පුබ්බන්තොව විය ලොපෙ විභත්තියා
අඤ්ඤථා ත්වඤ්ඤථා තත්ථ යාදෙසාදි පරාදි ච
චාදි පුබ්බපදන්තා ච නිච්චං පුබ්බ පදස්සිතා
පාදයො නිච්චසම්බන්ධා පරාදී ච පරෙනතු

තත්ථ පුබ්බා පරා නෙකවණ්ණා පදමජ්ඣෙ යථා:

නමාමි සිරසා චාමිකරවණ්ණං තථාගතං.

පච්චුදාහරණං යථා:

සකලාපි දිසා සිඤ්චතෙව සොණ්ණරසෙහි යො
විභත්තියාලොපෙ පුබ්බන්තො සරො යථා.

නමාමි සිරසා සබ්බොපමාතිතං තථාගතං
අලොපෙ විභත්තියා පරාදිව සරො යථා.

යස්ස ලොකග්ගසම්පත්තාසෙසොපමා නාභියුජ්ජති
යාදෙසාදි පරාදී ච යථා.

මුනින්දං සිරසා වන්දාම්‍යනන්තමතිමුත්තමං
නිච්චං පුබ්බපද සම්බන්ධාචාදයො පුබ්බපදන්තාව යථා.

**11 සමමඩ්ඪසමං වුත්තං විසමඤ්චාපරං තිධා**
**සමා ලක්ඛණතො පාදා චත්තාරො යස්ස තං සමං,**

**12 යස්සන්තිමෙන දුතියො තතියෙනාදිමො සමො**
**තදඩ්ඪසමමඤ්ඤන්තු භින්නලක්ඛණපාදිකං**

**13 පාදමෙකක්ඛරාරබ්භ යාව ඡබ්බීසතක්ඛරෙ** a
**භවෙ පාදෙහි තං ඡන්දං නානා නාමො දිතං තතො**

---

යස්ස මෙත්තා ච පඤ්ඤා ච නිස්සීමාති විජම්භති
පාදයො චාදයොපි දමෙවොදාහරණං
උභයත්ථ පච්චුදාහරණං යථා

මහා මෙත්තා මහා පඤ්ඤා ච යත්ථ පරමො දයා
පණමාමි ජිනානං පවරං වර ගුණාලයං

මේ අනිෂ්ටප්‍රවෘත්තයෙහි පාදාන්ත යතිය ගෙණ යති සරූප පරිඥානයට උපදෙශ කළනියාය මතු යතියක් කී යම්තැනෙක කල්පනා කටයුතු.

11. සමං වුත්තං, සමවෘත්තය; අඩ්ඪසමං වුත්තං, අර්ධසමවෘත්තය; අපරං, අන්‍යවූ; විසමඤ්චවුත්තං, විෂමවෘත්තයයිකියා; තිධා, (වර්ණවෘත්තය) ත්‍රිප්‍රකාරවේ; යස්ස, යම්වෘත්තයක්හුගේ, චත්තාරො පාදා, පාදයෝ සතරදෙන; ලක්ඛණතො, ලක්ෂණහෙයින්; සමා, සමයෝද; තං, ඒ වෘත්තය; සමං, සමවෘත්ත නම්

12. යස්ස, යම් වෘත්තයක්හුගේ; දුතියො, දෙවන පාදයතෙම; අන්තිමෙන, අන්තිමයෙහිවූ පාදය හා; සමො,(ලක්ෂණහෙයින්)සමද; ආදිමො, ආදියෙහිවූ පාදයතෙම; තතියෙන, තුන්වනපාදය හා; සමො, (ලක්ෂණහෙයින්) සමද; තං, ඒවෘත්තය; අඩ්ඪසමං, අර්ධසම වෘත්තය නම්වේ; අඤ්ඤන්තු, අන්‍යවූ විෂමවෘත්තය වනාහි; භින්න ලක්ඛණපාදිකං, යථොක්තලක්ෂණයෙන් භින්නවූ ලක්ෂණඇති පාද ඇත්තේයි.

දැන් වර්ණවෘත්තයෙහි කී ශාස්ත්‍රාන්තරයෙහි ව්‍යවස්ථාව පූර්ව කොට දක්වා තන්මුඛයෙන් ශාස්ත්‍රව්‍යවස්ථාව කටැපිව "පාදමෙකක්ඛරාරබ්භ" යනාදි ආරබධයි.

13. එකක්ඛරං පාදං ආරබ්භ, එකාක්ෂරපාදය පටන්; යාව, යම්තාක්; ඡබ්බීසතක්ඛරෙ, සවිසිවන අකුරුඇති පාදයද; තාව, එතාක්; පාදෙහි, පාදයන් කරණකොටගෙණ; නානා නාමොදිතං, නොයෙක් නමින් පහළවූ; තං, ඒ; ඡන්දං භවෙ, ඡන්දස්නම් වන්නේය; තතො, ඒසවිසිවන අකුරුඇති පාදයෙන් මත්තෙහි;

---

a ටීකායෙහි
එකක්ඛරතො පට්ඨාය ඡබ්බීසති භවන්ති—තතො එකෙකං ඡන්දං චතුප්පදවසෙන චතු චතු අක්ඛරතො වුද්ධි භවති—තෙන

## 14 දණ්ඩකා චණ්ඩවුට්ඨ්‍යාදි පාදෙහි ඒහි තිහි තු ගාථානිච පරත්ථෙවං ඡන්දො සඤ්ඤා පකාසිතා

14 චණ්ඩවුට්ඨ්‍යාදි, චණ්ඩ වෘෂ්ට්‍යාදීහු; දණ්ඩකා, දණ්ඩක වෘත්ත යෝ වෙති; ඒහි තීහි තු පාදෙහි, සපාදයකින් තුන්පාදයකින් වනාහි; ගාථානිච, ගාථායයි කියාද; එවං, මෙසේ; පරත්‍ර, පරශාස්ත්‍රයෙහි; ඡන්දො සඤ්ඤා, ඡන්දඃසංඥතොමෝ; පකාසිතා, ප්‍රකාශ කරණලදී.

---

පඨමච්ඡන්දසි වුත්තෙනා චතුසු පාදෙසු චතුරක්ඛරානි—දුතියෙ අට්ඨ–තතියෙ වාදසාති–යාව ඡබ්බීසතිමෙ චතුරක්ඛරාධිකා සතං භවන්තීති දීපෙති–තංනාමානි තෙසු වුත්තෙසු–තෙසං නාමානි පරතො සෙසෙසු ඡන්දෙසු ආදිතොපට්ඨාය වක්ඛති වුත්තං–තං යථා.

උත්තා (1)–අච්චුත්තා (2)–මජ්ඣා (3)–පතිට්ඨා (4)–සුප්පතිට්ඨා (5)–ගායත්ති (6)–උණ්හි (7)–අනුට්ඨුභි (8)–බ්‍රහතී (9)—පන්ති (10)–තුට්ඨුභි (11)–ජගති (12)–අතිජගති (13)–සක්කරී (14)–අතිසක්කරී (15)–අට්ඨී (16)–අච්චට්ඨී (17)–ධිති (18)–අතිධිති (19)–කති (20)–පකති (21)–ආකති (22)–විකති (23)–සඞ්කති (24)–අභිකති (25)–උක්කති (26)–ති ඡබ්බීසති

තත්‍ර– පඨමච්ඡන්දසි වෙවුත්තානි (2)– දුතියෙ චත්තාරි (4)– මජ්ඣාය අට්ඨ (8)–පතිට්ඨාය සොළස (16)–සුප්පතිට්ඨාය චත්තිංසා (32)–ගායත්තියා චතුසට්ඨී (64)–උණ්හියා අට්ඨවීසුත්තරසතං (128)–අනුට්ඨුභියා ඡප්පඤ්ඤාසාධික ද්විසතං (256)–බ්‍රහතියා වාදසුත්තර පඤ්චසතං (512)–පන්තියා චතුවීසුත්තර සහස්සං (1024)–තුට්ඨුභියා අට්ඨතාළීසුත්තර ද්විසහස්සං (2048)–ජගතියා ඡන්නවුතාධික චතුසහස්සං (4096)—අතිජගතියා වෙනවුතුත්තරසතඤ්ච අට්ඨ සහස්සඤ්ච (8192)–සක්කරියං සොළසසහස්සාධිකතිසතං චතුරාසීති (16384)–අතිසක්කරියං චත්තිංසසහස්සතොධිකානි සත්තසතානි අට්ඨසට්ඨීච (32768)–අට්ඨියං පඤ්චසට්ඨිසහස්සාධික පඤ්චසතානි ඡත්තිංසාච (65536) – අච්චට්ඨියං ද්විසත්තතාධික එකතිංස සහස්සානිච ලක්ඛමෙකං (131072) – ධිතියා චතුචත්තාළීසුත්තර සතඤ්ච වෙසට්ඨිසහස්සානි ලක්ඛවයං (262144)–අතිධිතියා අට්ඨාසීතුත්තර ද්විසතානි චතුවීසති සහස්සඤ්ච පඤ්ච ලක්ඛං (524288)–කතියා ඡසත්තතුත්තර පඤ්චසතානි අට්ඨචත්තාළීසහස්සානි දස ලක්ඛං (1048576)–පකතියා වෙපඤ්ඤාසාධික සතං සත්තනවුති සහස්සං විසති ලක්ඛං (2097152)–ආකතියා චතුධිකානි තිනිසතානි චතුනවුති සහස්සානි එකතාළීසලක්ඛං (4194304)–විකතියා අට්ඨාධික ඡසතානි අට්ඨාසීති සහස්සානි තෙඅසීති ලක්ඛානි (8388608)–සඞ්කතියා සොළසාධික ද්විසතානි සත්තසත්තතිසහස්සානි සත්තසට්ඨී ලක්ඛානි කොටිමෙකං (16777216)–අභිකතියා ඛත්තිංසාධික චතුසතානි චතුපණ්ණාසසහස්සානි පඤ්චතිංසලක්ඛානි කොටිත්තයං (33554432)–උක්කතියා චතුඡට්ඨාධික අට්ඨසතානි අට්ඨසහස්සානිච එකසත්තති ලක්ඛානි ඡකොටී (67108864)තිඤාතබ්බානි.

**15 අනන්තරොදිතං චාඤ්ඤමෙතං සාමඤ්ඤනාමතො**
**ගාථාමිච්චෙව නිද්දිට්ඨා මුනින්දවචනෙ පන.**

**16 විසෙසනාමතො කිඤ්චි ගහෙත්වා සබ්බථොචිතං**
**දස්සයිස්සාමහන්තෙත්ථ නාමානාවිභවිස්සරෙ.**

ඉති වුත්තොදයෙ ඡන්දසි සඤ්ඤාපරිභාසානිද්දෙසො නාම
පඨමො පරිච්ඡෙදො

**1 ඡට්ඨොඛිල ලහු ජො වා ගයුතාඤ්ඤෙ ඡගණානජොවිසමෙ**
**අට්ඨියාසනන්තද්ධෙ ලො ඡට්ඨොනෙන ගො ගණා ඡඤ්ඤෙ.**

---

15 අනන්තරොදිතංච, (පාදමෙකක්ඛරාරබ්භයනාදින්)අනන්තරයෙහි කියනලද වර්ණවෘත්තයෙහි ඡන්දස්ද; අඤ්ඤඤ්ච, මෙයින් අන්‍යවූ මාත්‍රාවෘත්තයෙහි ආ නොයෙක් ඡන්දස්ද යන; එතං, මේ සියල්ල; මුනින්දවචනෙ පන, සර්වඥවචනයෙහි වනාහි; සාමඤ්ඤනාමතො; සාමාන්‍යනාම හෙයින්; ගාථාඉච්චෙව, ගාථායයි කියාම; නිද්දිට්ඨා, කියනලදී.

පරශාස්ත්‍රයෙහි මාත්‍රාවෘත්ත වර්ණවෘත්ත දෙක නොයෙක්නමින් වෘත්ත විභාගකොට අසමජසගාථායයි ව්‍යවස්ථාකළහ. බුද්ධවචනයෙහි වූකලි යථොක්ත සියල්ලටම ගාථා ව්‍යවහාරය සාමාන්‍යනාමයෙක යනු මෙහි අභිප්‍රායයි.

සමස්තවෘත්තම ගාථාබැවින් කියයුත්තෙහි වෙනසක් නැද්ද යනු ආශංකාකොට විශෙෂනාමයෙන් කියයුතු ඇතැයි දක්වනු පිණිස විසෙසනාමතො යනු නිර්දිෂ්ටයි.

16 විසෙසනාමතො, විශෙෂනාමයෙන්; සබ්බථොචිතං, සර්වප්‍රකාරයෙන් උචිතවූ; කිඤ්චි, කිසි වෘත්තයක්; ගහෙත්වා, ගෙණ; අහං මම, එත්ථ, මේවෘත්තොදයෙහි; දස්සයිස්සාමි, දක්වමි; (දැක්වියයුතු වෘත්තවිශෙෂයෙහි නම් කිම්දයත්) නාමානි, (දැක්වියයුතු ඡන්දස් වෘත්ත) නාමයෝ; ආවිභවිස්සරෙ, ඒ ඒ ස්ථානයෙහි මතුපහළ වන්නාහුය.

පඨමො පරිච්ඡෙදො

1 ඡට්ඨො, සවෙනි ගණයතෙම; අඛිලලහු, සර්වලඝුගණය හෝ වෙයි; ජො වා, ජගණය හෝ වෙයි; ගයුතා, ගුරුයුක්තවූ; අඤ්ඤෙ ගණා, සෙසු ගණයෝ; ඡ, සදෙනෙකි; (මෙයින් ආර්යාවගේ පූර්වාර්ධයෙහි සාමාන්‍ය ලක්ෂණ කීහු–මෙහි "ගණාන"යි සවෙනිව ජගණයයි) විසමෙ, ප්‍රථම තෘතිය පඤ්චම සප්තම ගණ විෂමය එහි; නජො,

**2 පඨමඩ්ඪෙ ඡට්ඨො චෙ සබ්බලහු සථාදි ලහුනි භවති යති**
**තප්පරකොන්තෙපි සචෙ චරිමෙපි භවති චතුත්ථො න්තෙ**

**3 අරියා සාමඤ්ඤෙනෙව පුබ්බාදිතලක්ඛණං භවෙ යස්සා**
**ආදිමමථ පාදයුගං යස්සා ත්‍යංසෙහි සා පථ්‍යා.**

---

ජගණ නැති; (අන්තයෙහි මෙය ගුරු දක්වා සප්තගණ ගණාඩියයි) අරියායං, ආයර්‍යායෙහි; අන්තඩෙ; අන්ත්‍යාඩියෙහි, ඡට්ඨො, සවෙනි වූයේ; ලො, ලඝුය; අන්තෙ, අන්තයෙහි; ගො, ගුරුය; අඤ්ඤ ගණා, සෙසු ගණයෝ; ජ, සදෙනෙකි.

මෙයින් අපරාඩියට සාමාන්‍ය ලක්ෂණ කීහු–මෙහි සවෙනිව "ග" යනු ලඝුය අන්තයෙහි "ඤ" යනු ගුරුය "අරියා" යන සගණය ආදිවූ සෙසුගණ සයකි—මෙහිදු විෂමයෙහි ජගණ නොලියයුතු.

2 පඨමඩෙ, ප්‍රථමාඩියෙහි; ඡට්ඨො, සවෙනි ගණය; චෙ, ඉදින්; සබ්බලහු, සර්වලඝුගණයෙක් විනම්; චෙ, ඉදින්; තප්පරකො, ඒසර්ව ලඝුගණය පරකොට ඇත්තේවීනම්; එතඑ, මේ සර්වලඝුගණයෙහි; ආදිලහුනි, ප්‍රථම ලඝුහු කෙරෙන්; යති භවති; යතියවේ; සො, ඒසර්ව ලඝුගණය තෙම, සචෙ, ඉදින්; තප්පරකො, ඒසර්වලඝුගණය පර කොට ඇත්තේවිනම්; අන්තෙපි, (සවෙනි ලඝුගණයාගේ) අන්තයෙ හිද, යතියවේ.

මෙහි "භවති" යන සර්වලඝුගණය පරකොටඇති "දිලහුනි" යන සවෙනි ලඝුගණයයි–මෙහි "දි" යන ආදි ලඝුයෙහි පදච්ඡේදය "නි"යන අන්තලඝුයෙහි පදච්ඡේදයයි.

චරිමෙ, ආයර්‍යාඅපරාඩියෙහි; චතුත්ථො, සතරවෙනිගණය; (තප්පරකොයනුවේ) තප්පරකො, එසර්වලඝුගණය පර කොට ඇත් තේ විනම්; අන්තෙපි භවති, (සර්වලඝුගණයාගේ) අන්තයෙහිද යතිය වෙයි, අපිශබ්දයෙන් ආදියෙහිද යතියවේ.

මෙහි "චරිමෙ" යන සතරවෙනි ගණය "පිභවති" යන සර්වලඝු ගණය පරකොට ඇත්තේය—එහෙයින් "පි" යන ආදිලඝුයෙහිදු පදච්ඡේදය–"ති" යන අන්තලඝුයෙහිදු පදච්ඡේදයයි· මෙයින් ආයර්‍යා පූර්වාඩි අපරාඩියට සාමාන්‍යයෙන් යතිලක්ෂණ කීහු.

3 යස්සා, යමකට; චෙ, ඉදින්; පුබ්බාදිතං, පූර්වයෙහි කියන ලද; අරියා සාමඤ්ඤං ලක්ඛණං භවෙ, ආයර්‍යාසාමාන්‍ය ලක්ෂණවේද; අථ, නැවත; යස්සා; යමකගේ; ආදිමංපාදයුගං, (උභයාඩියෙහි) ආදි පාද යුගමය, ත්‍යංසෙහි, ත්‍ර්‍යංසයකින් හෙවත් ගණතුණකින්වේද; සා, ඕතොම; පථ්‍යා, පථ්‍යානම්වා.

"අරියාසාමඤ්ඤෙනෙව" කියාද "ආදිමමථපාදයුගං" කියාද පාද වය තුන්ගණයෙනි.

**4 යත්‍ථ ගණත්තයමුල්ලංඝියොභයත්‍ථාදිමො භවෙ විපුලා.**

**5 ගුරුමජ්ඣගො ජකාරො චතුත්‍ථකො දුතියකො චපලා.**

**6 චපලාගතං බිලකෙව දලාදිමං ලක්ඛණං භජති යස්සා
පථ්‍යා ලක්ඛණමඤ්ඤං මුඛචපලා නාම සා භවති.**

**7 පථ්‍යාය ලක්ඛණඤ්චෙව පඨමද්ධෙ ලක්ඛණන්තු චපලායා
දුතියෙ දලෙථ යස්සා පකිත්තිතා සා ජඝනචපලා.**

අරියා ජාතයො.

**1 සබ්බං පඨමදලෙ යදි ලක්ඛණමරියායං වුත්තමුභයෙසු
යස්සා දලෙසු යුත්තං වුත්තා සා ගීති වුත්තයතිලලිතා.**

---

4 යත්‍ථ, යමෙක්හි; උභයත්‍ථ, උභයාර්ධයෙහි; ගණත්තයං, ගණ තුණක්, උල්ලංඝිය, ඉක්ම, ආදිමො භවෙ, ප්‍රථම පාදය වේද; සා, හෝතොම; විපුලා, විපුලා නම්වා.

මෙහි ගණත්‍රයක් ඉක්ම "උල්ලඞ්ඝිය" යන යකාරයෙන් යති යයි. අපරාර්ධයෙහිද මෙසේම කල්පනා කටයුතු.

5 යස්සා, යමකගේ; චතුත්‍ථකො, සතරවෙනිවූද; දුතියකො, දෙවෙනිවූද; ජකාරො, ජගණය; ගුරුමජ්ඣගො, ගුරුමධ්‍යගතද; සා, හෝතොම; චපලා, චපලානම්වා.

මෙහි "ඣගොජ" යන දෙවෙනි ජගණය "ම–කා" යනු ගුරු මධ්‍යගතයි "චතුත්‍ථ" යන සතරවෙනි ජගණය "රො–කො" යන ගුරුමධ්‍යගතයි–මෙහි පූර්වාර්ධය කල්පනා කටයුතු.

6 යස්සා, යමකගේ; ආදිමං දලං, ප්‍රථමාර්ධය; චපලාගතං, චපලා යෙහි ආ; අඛිලංලක්ඛණං, සියලු ලක්ෂණය; එව, ඉදින්; භජති; සෙවුනේද; අඤ්ඤං, අන්‍යවූ අපරාර්ධය; පථ්‍යාලක්ඛණං භජති, පථ්‍යායෙහි ලක්ෂණය සෙවුනේද; සා, හෝතොම; මුඛචපලානාම භව ති; මුඛචපලානම්වා.

7 යස්සා, යමකගේ; පඨමද්ධෙ, ප්‍රථමාර්ධයෙහි; එව, ඉදින්; පථ්‍යාය ලක්ඛණං, පත්‍ථ්‍යාවගේ ලක්ෂණවේද; අථ, නැවත; දුතියෙ දලෙතු; දෙවන අර්ධයෙහි වනාහි; චපලායා ලක්ඛණං, චපලාවගේ ලක්ෂණවේද; සා, හෝතොම; ජඝනචපලා පකිත්තිතා, ජඝනචපලා යයි කියනලද්දී.

අරියා ජාතයො.

1 අරියායං, ආර්යායෙහි; පඨම දලෙ, ප්‍රථමාර්ධයෙහි; වුත්තං, කියනලද; සබ්බං ලක්ඛණං; සියලුලක්ෂණය; යදි, ඉදින්; යස්සා,

**2 අරියායං දුතියඩ්ඪෙ ගදිතං ඛිල ලක්ඛණං යං තං**
**භවති දලෙසුභයෙසු පි යදි යස්සා සායමුපගීති.**

**3 අරියායද්ධමිතයං පුබ්බාදිත ලක්ඛණුපෙතං**
**විපරියයෙනාභිහිතං යස්සා සමභවති වෙහ සොග්ගීති.**

**4 අරියා පුබ්බඩ්ඪං යදි ගරුනෙකෙනාධිකෙන නිධනෙ යුත්තං**
**යදි පුබ්බඩ්ඪසමානං දලමිතරඤ්චොදිතායමරියාගීති.**

ගීති ජාතයො.

---

**1 විසමෙ ජ සියුං කලා මුඛෙ සමෙතට්ඨ රලගා තතොපරි**
**වෙතාලියන්තමුච්චතෙ ලහු ඡක්කං න නිරන්තරං සමෙ.**

---

යමකගේ; උභයෙසුදලෙසු, උභයාර්ධයෙහි; යුත්තං, යුක්තද; වුත්ත, (ආර්‍ය්‍යායෙහි) කියනලද; යතිලලිතා; යතින් හොබනාවූ; සා, හෝ තොම; ගීති වුත්තා, ගීතියයි කියනලදු.

2 අරියායං, ආර්‍ය්‍යායෙහි; දුතියඩ්ඪෙ, දෙවනාර්ධයෙහි; ගදිතං, කියනලද; යං අඛිලලක්ඛණං, යම් සියලු ලක්‍ෂණයෙක් ඇද්ද; තං, ඒලක්‍ෂණය; යදි, ඉදින්; යස්සා, යමකගේ; උභයෙසු දලෙසු අපි,උභ යාර්ධයෙහිම වේද; සා අයං, ඕමෝතොමෝ; උපගීති, උපගීති නම්වා.

3 පුබ්බාදිත ලක්ඛණුපෙතං, (ආර්‍ය්‍යායෙහි) පූර්වොදිත ලක්‍ෂණ යෙන් යුක්තවූ; අරියායඩ්ඪිතයං, ආර්‍ය්‍යාවගේ උභයාර්ධය; වෙ, ඉදින්; විපරියයෙනාභිහිතං, විපර්‍ය්‍යයෙන් කියනලද්දේ; යස්සා, යමකට; සම්භවති, සම්භවවේද;සා, හෝතොම; ඉහ, මේ ගීතිජාතයෙහි; උග්ගී ති, උග්ගීති නම්වා.

4 අරියාපුබ්බඩ්ඪං, ආර්‍ය්‍යපූර්වාර්ධය; අධිකෙන, අධිකවූ; එකෙන ගුරුනා, එකගුරුකක්විසින්; නිධනෙ, කෙළවර; යදි, ඉදින්; යුත්තං යුක්තවූයේ, (යමකගේ පූර්වාර්ධයෙහිවේද) ඉතරඤ්චදලං, අපරාර්ධය; යදි, ඉදින්; පුබ්බඩ්ඪ සමානං, (තමාගේ) පූර්වාර්ධය හා සමානද; අයං මෝතොම; අරියාගීති උදිතා, ආර්‍ය්‍යාගීතියයි කියනලදු.

මේ පර්‍ය්‍යායර්‍ය්‍යාගෙන කළ කල්පනාය විපුලාදියෙහිදු මෙසේම ගීති කල්පනා කටයුතු.

ගීති ජාතයො.

---

1 (යස්ස, යමක්හුගේ;) විසමෙ, විෂමපාදයෙහි –හෙවත් – ප්‍රථම තෘතීය පාදයෙහි; ඡ කලා සියුං, කලාවෝ සදෙනෙක් වෙද්ද; සමෙ තු, සමපාදයෙහි වනාහි–හෙවත්–දෙවන සතරවන පාදයෙහි; මුඛෙ, ආදියෙහි; අට්ඨකලා, කලාවෝ අටදෙනෙක් වෙද්ද; තතොපරි, එයින් මත්තෙහි; රලගා, රගණ ලඝු ගුරු වෙද්ද; සමෙ, සමපාදයෙහි;

**2 වෙතාලියොපමං මුඛෙ තං ඔපච්ඡන්දසිකං රයා යදනෙන.**

**3 ආපාතලිකා කථිතාසං භගගානෙන යදි පුබ්බමිවඤ්ඤං**

**4 යදාදිතො දක්ඛිණන්තිකා සියොත්ථ පාදෙසාඛිලෙසු ජො.**

**5 උදිච්චවුත්තිති වුච්චතෙ ජොචාදෙ විසමෙසු සණ්ඨිතො.**

**6 පුබ්බත්ථ සමෙසු චෙ ගජා පච්චවුත්ති රුදිතෙති සණ්ඨිතා.**

**7 සමාසමාත්‍රාදිනං සමාසංයුතා භවන්තිතං පවත්තකං.**

---

නිරන්තරං, අතුරු නැතිව; ලහුජ්ඣකකං න, ලඝු ෂට්කයෙක් නොවේද; තං, ඒ; වේතාලියං උච්චතෙ, වෛතාලියයි කියනුලැබේ.

මෙහි "ඝ" යන්නට කලාසයය–ඔබ්බේ "රලග" යෝයි "රල" යන්නට අටකලාවය ඔබ්බේ"රලග"යෝයි–අපරාඕයද මෙසේමැයි–මෙහි දෙවන සතරවන පාදයෙහි නිරන්තරව ලඝු ෂට්කයෙක් නැති–මේලක්‍ෂණය මතුකියන වෛතාලීය ජාතියෙහිද යොදා දතයුතු.

2 (යං, යමෙක්;) මුඛෙ, ආදියෙහි; යදි, ඉදින්; වෙතාලියොපමං, වෛතාලීය හා සමද; අනෙන, කෙලවර; රයා, රගණ යගණයෝ වේද්ද; තං, ඒ; ඔපච්ඡන්දසිකං, ඖපච්ඡන්දසික නම්වේ.

3 (යස්සා, යමකගේ;) අනෙන, පාදාන්තයෙහි; යදි, ඉදින්; භගගා, භගණගුරු දෙන්නෙක් වේද්ද; අඤ්ඤං, සෙස්ස; පුබ්බමිව, පූර්වැනිද; අයං, මෝතොමෝ; ආපාතලිකා කථිතා,ආපාතලිකා යයි කියන ලදී.

4 (යස්සා, යමකගේ;) අඛිලෙසු පාදෙසු, සියලු පාදයෙහි; ආදිතො, ආදියෙහි; යදි, ඉදින්; ජො සියො, ජගනයෙක් සිටියේ වීනම්; සා, ඕතොමෝ; එත්ථ, මේ වෛතාලීයෙහි; දක්ඛිණන්තිකා, දක්ඛිණන්තිකා නම්වා.

මෙහි "යදාදි" කියාද "සියොත්ථ" කියාද ජගණයයි.

5 විසමෙසු, විෂම පාදයෙහි; ආදෙ, ආදියෙහි; ජොචසණ්ඨිතො, ජගණයකුදු සිටියේ වීනම්; උදිච්චවුත්තිති වුච්චතෙ, (ඕතොමෝ) උදිච්චවුත්තියයි කියනු ලැබේ.

6 සමෙසු, සමපාදයෙහි; පුබ්බත්ථ, පූර්වයෙහි; චෙ, ඉදින්; ගජා ගුරුජගණයෝ වූනම්, ඉති සණ්ඨිතා, මෙසේ සිටියා; පච්චවුත්ති උදිතා, ප්‍රාච්‍යවෘත්තියයි කියන ලදී.

7 (යස්මිං, යමෙක්හි,) ආදිනං, උදිච්චවුත්ති පච්චවුත්ති දෙදෙනාගේ; සමාසමා, සම විෂම පාදයෝ; සමා සංයුතා, සම වූවාහු සංයුතයෝද; තං, ඒ; අත්‍ර; මෙහි; පවත්තකං, ප්‍රවෘත්තක නම්.

**ඖපච්ඡන්දසෙහි පටන් මේ ප්‍රවෘත්තකය දක්වා වෛතාලීය කොට ගාථාමූල කටයුතු.**

**8 අසස යා සමකනාපරාන්තිකා.**
**9 තදඤ්ඤජා චාරුහාසිනී.**

වේතාලි ජාතයො.

**1 මිකා විහතා වසු ලගු රවලඩ්ඩිති ඊහ.**
**2 මත්තාසමකං නවමො ලගනෙන.**
**3 ජොනලාථ වාණණවා විසිලොකො.**
**4 නවයතො වානවාසිකාබ්‍යා.**
**5 පඤ්චමට්ඨනවසු යදි ලො චිත්‍රා.**
**6 ගල්‍යාටඨ්ගි වෙ සා වුපචිත්‍රා.**

---

8 අසස, මේ ප්‍රවෘත්තයාගේ; සමකනා යා, සමපාදයෙන් කරණ ලද යමක් ඇද්ද; (ඕතොමෝ) අපරාන්තිකා, අපරාන්තිකා නමු.

9 තදඤ්ඤජා, ඒ සමපාදයෙන් අන්‍යවූ විෂමපාදයෙන් ජාතවූ වා; චාරුහාසිනී, චාරුහාසිනී නමු.

මේදෙක චතුරාවෘත්තකොට ගාථාමුලු කටයුතු.

වෙතාලිය ජාතයො.

1 මිකා, දෙකින්; විහත, ගණනලද; වසු ලගු, අටලඝුවක් ඇත්තී හෙවත් සොළොස් ලඝුවක් ඇත්ති; ඉහ, මෙහි; අවලඩ්ඩිතී, අ වල ඩ්ඩිතිනමු.

2 නවමො, නවවැනිවූ; ල්, ලඝුයෙක් ඇත්තේ වීනම්; අනෙන, කෙළවර; ග්, ගුරෙක් වීනම්; මත්තාසමකං, මාත්‍රාසමක නමි.

මෙහි "කං" යන්නට මාත්‍රා අටය-"න" යනු නවවන ලඝුවයි.

3 අණණවා, සතරකින්; ජො, ජගණය වේද; අථවා, නොහොත්; නලා, නගණ ලඝු දෙන්නෙක් වේද්ද; විසිලොකො, (ඒ) විසිලොකනමි.

මෙහි ආදියෙන් සතර මාත්‍රාවකින් පරව ජගණයයි.

4 නවයතො, ඒ අණණව දෙකින් පරව හෙවත් අටමාත්‍රාවකින් පරව; ("ජොනලාථවා" යනු සම්බන්ධවේ-ජගණයගෝ නොහොත් නගණ ලඝු හෝවූනම්;) වානවාසිකාබ්‍යා, වානවාසිකානමු.

5 පඤ්චමට්ඨනවසු, පස්වන අටවන නවවන්හොහි; යදි, ඉදින්; ලො, ලඝුයෙක් වීනම්; චිත්‍රා, චිත්‍රානමු.

6 (යසසා, යමකගේ;) අටඨ්හි, අට මාත්‍රාවකින්; වෙ, ඉදින්; ගල්‍යා, ගුරුලඝු යන මොහු වූනම්; එසා, මෝතොමෝ; උපචිත්‍රා, උප චිත්‍රානමු.

මාත්‍රා සමාදි හැම චතුරාවෘත්ත කටයුතුයි--හැමපයෙහිම සොළොස් මාත්‍රාවක්ම පිරියයුතුයි.

**7 යමතීතලක්ඛණවිසෙසයුතං**
**මත්තාසමාදිපාදභිහිතං**
**අනියතවුත්තපරිමාණසහිතං**
**පථිතං ජනෙසු පාදකුලකං.**

මත්තාසමකජාතයො.

---

**1 විනා වණ්ණෙහි මත්තා හා විනා වණ්ණාගුරූහිතු**
**විනා ලහුනි ගුරවො දලෙ පථ්‍යාදිනො මතා.**

ඉති මත්තා වුත්තිනිද්දෙසො නාම
දුතියො පරිච්ඡෙදො.

---

---

7 යං, යමෙක්; අතීතලක්ඛණවිසෙසයුතං, යට මාත්‍රාසමකපාද යෙහි කී ලක්‍ෂණ විශෙෂයෙන් යුක්තද; මත්තා සමාදිපාදභිහිතං, (එහෙයින්) මාත්‍රා සමකාදිපාදයෙන් කියනලද්ද; අනියතවුත්ත පරිමාණ සහිතං, (මේවෘත්තය මේ වෘත්තය හා එක්වෙයි යන නියම නැතිහෙයින්) නියමයක් නැති වෘත්ත පරිමාණයෙන් යුක්තද; (තං, ඒ වෘත්තය;) පාදකුලකං, පාදකුලක නමැයි; ජනෙසු, (ඡන්දස් වෛදික) ජනයාකෙරෙහි; පථිතං ප්‍රසිද්ධයි.

මෙහි ප්‍රථම පාදය මාත්‍රාසමක විශ්ලෝක චිත්‍රපාද වෙයි, භිතීය පාදය විශ්ලෝකවේ, තෘතීය පාදය මාත්‍රාසමක වානවාසිකවේ, චතුර්ථපාදය විශ්ලෝකවේ.

මත්තා සමක ජාතයො.

---

1 පථ්‍යාදිනො, පථ්‍යාදි වෘත්තයාගේ; මත්තා, මාත්‍රාවෝ; වණ්ණෙහි විනා, වර්ණයන්හැර; හා මතා, ගුරුහයි දන්නාලදහ; ගුරූහිතු විනා,ගුරුන් හැර වනාහි; මත්තා, මාත්‍රාවෝ; වණ්ණා මතා වර්ණහයි දන්නාලදහ; මත්තා, මාත්‍රාවෝ; ලහුනි විනා, ලඝුන් හැර; දලෙ, අර්ධකළ කල්හි; ගුරවො මතා, ගුරුහයි දන්නාලදහු.

මේ පථ්‍යාදි වෘත්තයෙහි එකිඑකි ගාථායෙකහෝ ගාථාපදයක හෝ එකහෙලා මාත්‍රාගැණ අක්‍ෂරයනුදු ගැණ අක්‍ෂර සඞ්ඛ්‍යාව මාත්‍රා වෙන් සොයා ඉතිරිමාත්‍රා සඞ්ඛ්‍යා ගුරුසඞ්ඛ්‍යා වෙයි, ගුරුසොයා ඉති රිය වර්ණසඞ්ඛ්‍යාවෙයි, ලඝුන් වෙනමගැණ ඒ ලඝුසඞ්ඛ්‍යා සොයා ඉතිරි මාත්‍රාවන් දෙකක් කොට එක් කොටසක් පමණ ගුරුහුවෙති යන අභිප්‍රායයි.

දුතියො පරිච්ඡෙදො.

---

**1 න්‍යාවෙ තනුමජ්ඣා.** a

ගායත්‍රී b

**2 කුමාරලලිතා ජසගා.**

උණ්හි c

---

1 වෙ, ඉදින්; න්‍යා, නගණ යගණයෝ වූනම්; තනුමජ්ඣා, තනුමධ්‍යා නම්වේ.

මෙහි "න්‍යාවෙතනුමජ්ඣා" යි නගණ යගණයයි—මෙසේම වණ්වෘත්ත විනතාකටයුතු—ගායත්‍රී, ගායත්‍රීනම් ඡන්දසයි—උණ්හාදි යෙහිදු e අනෑ මෙසේම කියයුතු චතුරාවෘත්තයයි—මත්තෙහිදු මෙසේම දතයුතු.

2 ජසගා, ජගණසගණ ගුරුහු වූනම්; කුමාරලලිතා, කුමාරලලිතා නමු.

මතු වෘත්තනාමය අන්වයකල පමණකින් අනෑ මෙසේම දතයුතු.

(උණ්හි)

---

a ටීකායෙහි

ගො සිරි–ගො ඉච්චෙකො ගුරු පාදෙ පාදෙ භවති වෙ සිරිනාම වුත්තං භවති–(උත්තා)

ගා පී–පාදෙ පාදෙ ගුරුවයං භවති වෙ පීනාම භවති (අච්චුත්තා)

රො මිගී– පාදෙපාදෙ රකාරො භවති වෙ මිගීනාම භවති.

සො කුමාරී– පාදංපති සකාරො භවති වෙ කුමාරීනාම (මජ්ඣා)

රගා පුස්සදූ–පාදංපති රකාර ගකාරා භවන්ති වෙ පුස්සදූ නාම

නගා කුසුමා–පාදෙ පාදෙ නකාර ගකාරා භවන්ති සා කුසුමා නාම

(පතිට්ඨා)

භාමිනි රලගා–එතෙ ගණා භවන්ති වෙ භාමිනී භවති (සුප්පතිට්ඨා)

b ටීකායෙහි

න්‍යා මුකුලිතා–න්කාර යකාරා භවන්ති වෙ මුකුලිතා භවති.

සමා සුවිමුඛි–සමා ඉච්චෙතෙ භවන්ති සුවිමුඛි නාම.

යමා සිඛණ්ඩිනී–පාදංපති යාදයො භවන්ති සිඛණ්ඩිනීනාම.

c ටීකායෙහි

ආරොහනං භභගා–භාදයො ගණා භවන්ති වෙ ආරොහනං නාම

උඩ්ඩා රසගා–රාදයො භවන්ති වෙ උඩ්ඩා නාම.

e උණ්හාදියෙහිදු–සමහර

**3 චිත්‍රපද සදි භාගා.**
**4 මො මො ගො ගො විජ්ජුම්මාලා.**
**5 භා තලගා මානවකං.**
**6 ගලා සමානිකා රජ ච.**
**7 පමාණිකා ජරා ලගා.**

අනුට්ඨුභි a

**8 රා නසා සදි හලමුඛී.**
**9 භුජගසුසුභතා නා මො.**

බ්‍රහතී b

**10 මසා ජගා සුද්ධවිරාඩිතං මතං,**

---

3 යදි, ඉදින්; භා, භගණයෝ දෙන්නෙක්ද; ගා, ගුරුහු දෙන් නෙක්ද වූනම්; චිත්‍රපද, චිත්‍රපදනම්වේ.

4 මො, මගණයෙක් වීනම්; මො, නැවත මගණයෙක් වීනම්; ගො, ගුරෙක් වීනම්; ගො, නැවත ගුරෙක් වීනම්; විජ්ජුම්මාලා, විජ්ජුම්මාලා නමු.

5 භා, භගණයක්හුකෙරෙන්; තලගා, තගණ ලඝු ගුරුහු වූ නම්; මානවකං, මානවකනමි.

6 ගලා, ගුරුලඝුහුද; රජාච, රගණ ජගණයෝද වූනම්; සමා නිකා, සමානිකා නමු.

7 ජරා, ජගණරගණයෝද; ලගා, ලඝු ගුරුහුද වූනම්; පමාණි කා, පමාණිකා නමු. (අනුට්ඨුභි)

8 යදි, ඉදින්; රා, රගණයක්හු කෙරෙන් පරව; නසා, නගණ සගණයෝ වූනම්; හලමුඛි හලමුඛි නමු.

9 (යදි, ඉදින්;) නා, නගණයෝ දෙන්නෙක් වූනම්; මො, මගණයෙක් වීනම්; භුජගසුසුභතා, භුජගසුසුභතා නම්වේ. (බ්‍රහතී)

10 මසා, මගණ සගණයෝ දෙන්නෙක්ද; ජගා, ජගණ ගුරු දෙන්නෙක්ද වුනම්; සුඩවිරාඩිතං මතං, සුද්ධවිරාඩිතයයි දන්නාලදී

---

a ටීකායෙහි

හංසරුතා දුභදුගා–භචයං ගචයං භවන්ති චෙ හංසරුතා නාම.
දුරදුගා පදුමිනී–රචයං ගචයං භවන්ති චෙ පදුමිනීනාම.

b ටීකායෙහි

රජරා තරඞ්ගවති–රාදයො භවන්ති චෙ තරඞ්ගවති නාම.
හමසා මණිමජ්ඣා–හකාරාදයො භවන්ති චෙ මණිමජ්ඣා නාම

**11 මනා යො ගො යදි පණවො බ්‍යාතො.**
**12 භමා සගයුත්තා රුම්මවතී සා.**
**13 සෙදසා මුත්තා මභසග යුත්තා.**
**14 චම්පකමාලා චෙ භමසා ගො.**
**15 නරජගෙහි සා මනොරමා.**
**16 උබ්භාසකං තං චෙ තො මරා ගො.**

පන්ති [a]

**17 තජා ජගා ගරුනා සමුපට්ඨිතා.**
**18 ඉන්දාදිකා තා වජිරා ජගා ගො.**
**19 උපාදිකා සාව ජතා ජගා ගො.**

---

11 යදි, ඉදින්; මනා මගණ නගණයෝද; යො, යගණයෙක්ද; ගො, ගුරෙක්ද වීනම්; පනවො බ්‍යාතො, පනවයයි ප්‍රසිඩයි.

12 (යස්සා, යම්කගේ; භමා, භගණ මගණයෝ; සගයුත්තා, සගණ ගුරකින් යුක්තයෝද;සා,ඕතොමෝ; රුම්මවතී,රුම්මවතී නමු

13 (යා, යමක්;) මභසග යුත්තා, මගණ භගණ සගණ ගුරකින් යුක්තාද; (සා, ඕතොම;) මත්තා සෙදයා, මාත්‍රායයි දන්සුත්තියි.

14 චෙ, ඉදින්; භමසාගො; භගණ මගණ සගණ ගුරෙක් වී නම්; චම්පකමාලා; චම්පකමාලානමු.

15 (යා, යමක්;) නරජගෙහි, නගණ රගණ ජගණ ගුරකින් යුක්තාද; සා, ඕතොම; මනොරමා, මනොරමා නමු.

16 චෙ, ඉදින්; තො, තගණයෙක්ද; මරා මගණ රගණයෝ දෙන් නෙක්ද; ගො, ගුරක්ද වීනම්; තං, ඒ; උබ්භාසකං, උබ්භාසකනම්

(පන්ති)

17 ගරුනා, ගුරුහුහා එක්ව; තජා, තගණ ජගණයෝද; ජගා, ජගණ ගුරුහුද වූනම්; සාඅයං, ඕමෝතොමෝ, උපට්ඨිතා, උපට්ඨිතා නමු.

18 තා, තගණයෝ දෙන්නෙක්ද; ජගා, ජගණගුරුදෙන්නෙක් ද; ගො, ගුරෙක්ද වීනම්; (සා, ඕතොම) ඉන්දාදිකා වජ්රා,ඉන්ද්‍රශබ්දයා ආදිකොට ඇති වජ්‍රානම්වා හෙවත් ඉන්ද්‍රවජ්‍රානම්වා.

19 (යස්සා, යමකට; ජතා, ජගණ තගණයෝ දෙන්නෙක් වූ නම්; ජගා, ජගණ ගුරුදෙන්නෙක් වූනම්; ගො, ගුරෙක්වීනම්; උපාදිකා, උපයනු ආදිකොට ඇති; සාව, ඒ ඉන්ද්‍රවජ්‍රායි; උපෙන්ද්‍රවජ්‍රා යයි සේයි.

---

[a] ටීකායෙහි
රජරගා මයූරසාරිණී–එතෙ ගණා භවන්ති මයූරසාරිණී නාම.
මභසගා විලසිතා–එතෙ ගණා භවන්ති විලසිතා නාම.
මනරගා එකරූපා–එතෙ ගණා භවන්ති එකරූපා නාම.

**20 අනන්තරොදීරිතලක්ඛණා චෙ**
**පාදා විමිස්සා උපජාතියො තා**
**එවං කිරඤ්ඤාසුපි මිස්සිතාසු**
**වදන්ති ජාතිස්විදමෙව නාමං.**

**21 සජ්ජා ලගා ගදිතා සුමුඛී.**

**22 දොධකමිච්ඡති චෙ භභභා ගා.**

**23 වෙදස්සෙහි මගා තගාගසාලිනී සා.**

**24 වාතුම්මීයං යති සා මභා තගා ගො.**

---

20 අනන්තරොදීරිත, ඉක්බිත්තෙන් කියනලද; ලක්ඛණා, ලක්ෂණඇති; පාදා, ඉන්ද්‍රවජ්‍රා උපෙන්ද්‍රවජ්‍රා පාදයෝ; චෙ, ඉදින්; විමිස්සා, මිශ්‍රවූනම්; තා, ඒ; උපජාතයො, උපජාති නම්හුයි.

මෙහි ඉන්ද්‍රවජ්‍රායෙන් මධ්‍යපාද දෙක වනු–පළමුවනු සතරවනු පාද උපෙන්ද්‍රවජ්‍රාවෙයි–මේ එක් උපජාතියෙක යනාදීන් උපජාති භෙද කල්පනා කටයුතු.

අඤ්ඤාසුපි ජාතිසු, සෙසු වෘත්තජාතිහුදු; එවං කිරමිස්සිතාසු, මේ ශ්ලොකය හා මෙසේ දෙකළුකහෝ යෙදෙනසේ මිශ්‍රකරණලද කල්හී; ඉදමෙවනාමං, මෙමනම; වදන්ති, කියත්ල.

(මේ මෙයට උදහරණයි

කුම්භූපමං කායමිමං විදිත්වා
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යොධෙථ මාරං පඤ්ඤායුධෙන
ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා.

මේ ගාථායෙහි කමලා වංශස්ථ පාදදෙසාක, එකක් ඉන්ද්‍රවජ්‍රාය, එකක් උභාසකයයි–මෙසේම ප්‍රයොග සොයාම දතයුතු. ලක්ෂණ ගණයෙහි උපෙන්ද්‍රවජ්‍රා පාදයයි)

21 සජ්ජා, සගණය හා ජගණයෝ දෙන්නෙක් වූනම්; ලගා ලඝු ගුරුහු වූනම්; සුමුඛි ගදිතා, සුමුඛියයි කියනලදී.

22 චෙ; ඉදින්; භභභා, භගණයෝ තුන්දෙනෙක්ද; ගා, ගුරු දෙන්නෙක්ද වූනම්; දොධකමිච්ඡති, දොධක වෘත්තයයි කැමැති වනු ලැබේ.

23 වෙදස්සෙහි, සතරකින් හා සතකින් යතිය වීනම්; මතා, මගණ තගණයෝ දෙන්නෙක්ද; තගා, තගණ ගුරු දෙන්නෙක්ද, ග්, ගුරෙක්ද වීනම්; සා, ඕතොම; සාලිනී, සාලිනී නමු.

24 සා යති;ඕ යති වීනම් හෙවත් සතරෙන් සතෙන් යතිවූනම්; මභා; මගණ භගණයෝ වූනම්; තගා, තගණ ගුරුවූනම්; ගො, ගුරෙක් වීනම්; අයං, මෝතොම; වාතුම්මී, වාතුම්මී නමු.

**25 භා නනගා ගො සුරසසිරි සා.**
**26 රො නරා ඉධ රථොධතා ලගා.**
**27 ස්වාගතෙති රනභා ගුරුකා ච.**
**28 නනරලගුරුහි භද්දිකා.**

තුට්ඨුභං a

**29 වදන්ති වංසට්ඨමිදං ජතා ජරා.**
**30 සා ඉන්දවංසා ඛලු යස්ස තා ජරා.**
**31 ඉධ තොටකමම්බුධිසෙහි මිතං.**

---

25 භා, භගණයක්හු කෙරෙන් පරව; නනගා, නගණ නගණ ගුරෙක්වීනම්; ගො, නැවත ගුරෙක්වීනම්; සා, හෝතොම; සුරසසිරි සුරසසිරී නමු.

26 රො, රගණයෙක් වීනම්; නරා, නගණ රගණයෝ දෙන් නෙක් වූනම්; ලගා ලඝුගුරු දෙන්නෙක් වූනම්; ඉධ, මෙහි; රථොධ තා, රථොධතා නමු.

27 රනභා, රගණ නගණ භගණයෝ වූනම්; ගුරුකාච, ගුරුහු දෙන්නෙක් වූනම්; ඉති, මෙසේකල්හි; ස්වාගතා, ස්වාගතා නමු.

28 නනරලහුගුරූහි, නගණ දෙන්නෙක් රගණ ලඝු ගුරුන් කරණකොටගෙණ; භද්දිකා, භද්දිකා නමු. (තුට්ඨුභං)

29 (යස්මිං, යමෙක්හි;) ජතා, ජගණ තගණයෝ දෙන්නෙක්ද; ජරා, ජගණ රගණයෝ දෙන්නෙක්ද වූනම්; ඉදං, මේ වෘත්තය, වංසට්ඨං වදන්ති, වංශස්ථයයි කියත්.

30 යස්ස, යමෙක්හි; තා; තගණයෝ දෙන්නෙක්ද; ජරා, ජගණ රගණයෝ දෙන්නෙක්ද වූනම්; සා ඛලු, ඒතොමෝ වනාහි; ඉන්දවංසා, ඉන්දවංසා නමු.

31 අම්බුධිසෙහි, සගණ සතරකින්; මිතං, පරිමිතවූයේ; ඉධ, මෙහි; තොටකං. තොටක නමි.

---

a ටීකායෙහි
මභනලගා භමරවිලසිතා—මාදයො භවන්ති භමරවිලසිතා නාම.
නනසගගා වුත්තා–එතෙ ගණා භවන්ති වුත්තා නාම.
රජරලගා වෙතිකා–අයං වෙතිකා සියා.
ජසසලගා සංගතා–ජකාරාදයො සංගතා නාම.
ජසතගගා උපට්ඨිතා–ජාදයො උපට්ඨිතා නාම.
භතනගගා ලක්ඛිතා–පක්ඛවහි යති භවති සා ලක්ඛිතා නාම.

**32 දුතවිලම්බිතමාහ නභා භරා.**
**33 වසුයුගවිරති නා ම්‍යා පුටොයං.**
**34 නය සහිතා න්‍යා කුසුමවිචිත්තා.**
**35 භුජඞ්ගප්පයාතමහවෙ වෙදයෙහි.**
**36 නභජරෙහි හවති පියංවදා.**
**37 වුත්තා සුධීහි ලලිතා තභා ජරා.**
**38 පමිතක්ඛරා සජසසෙහුදිතා.**
**39 නනභර සහිතාභිහිතුජ්ජලා.**
**40 පඤ්චාසච්ඡිනා වෙස්සදෙවි මමා යා.**
**41 වදන්ති තාමරසං නජජා යො.**

---

32 නභා, නගණ භගණයෝ දෙන්නෙක්ද; භරා, භගණ රගණයෝ දෙන්නෙක්ද වූනම්; දුතවිලම්බිතමාහ, ද්‍රුතවිලම්බිතවෘත්ත යයි කීය.

33 වසුයුගවිරතී, අටකින් හා සතරකින් යතිය වීනම්; නා, නගණයෝ දෙන්නෙක් වූනම්; ම්‍යා, මගණ යගණයෝ දෙන්නෙක් වූනම්; අයං, මෝතොමෝ; පුටො, පුට නම්.

34 නය සහිතා, නගණ යගණ දෙකින් යුක්තවූ; න්‍යා, නගණ යගණයෝ වූනම්; කුසුමවිචිත්තා, කුසුමවිචිත්තා නම්.

35 වෙදයෙහි, සතර යගණයන් කරණකොටගෙණ; භුජඞ්ගප්පයාතං හවෙ, භුජඞ්ගප්‍රයාතය වේ.

36 නභජරෙහි, නගණ භගණ ජගණ රගණයන් කරණකොට ගෙණ; පියංවදා හවති, ප්‍රියංවදා වේ.

37 තභා, තගණ භගණයෝ දෙන්නෙක්ද; ජරා, ජගණ රගණයෝ දෙන්නෙක්ද වූනම්; සුධීහි, පණ්ඩිතවරුන්විසින්; ලලිතා වුත්තා, ලලිතායයි කියනලද්දී.

38 සජසසෙහි, සගණ ජගණයන් කෙරෙන් සගණ දෙකක් කරණකොටගෙණ; පමිතක්ඛරා උදිතා; ප්‍රමිතාක්ෂරායයි කියන ලද්දී.

39 නනභර සහිතා, නගණ දෙකකින් හා භගණයක් හා රගණයෙක් සහිත වීනම්; උජ්ජලා අභිහිතා, උජ්ජලායයි කියන ලද්දී.

40 මමා, මගණයෝ දෙන්නෙක්ද; යා, යගණයෝ දෙන්නෙක්ද වීනම්; පඤ්ච, පසකින්හා; අස්ස, සතකින්; ඡින්නා, සිඳුනු යති ඇත්තී; වෙස්සදෙවී, වෙස්සදෙවීනම්.

41 නජජා, නගණයක්හා ජගණයෝ දෙන්නෙක් වූනම්; යො, යගණයෙක් වූනම්; තාමරසං වදන්ති, තාමරසවෘත්තයයි කියාමැයි.

**42 කමලාති සෙදයා සයසෙහි යො ච.**

ජගතී a

**43 මනා ජරා ගො තිදස යතිපහාසිනී සා.**

**44 චතුගගහෙහිහ රුචිරා ජභා සජා ග්.**

අතිජගතී b

---

42 සයසෙහි, සගණ යගණ සගණයන් කෙරෙන් පරව; යො ච, යගණයෙක් වීනම්; කමලාති සෙදයා, කමලායයි දතයුතායි. (ජගතී)

43 මනා, මගණ නගණයෝ දෙන්නෙක්ද; ජරා, ජගණ රගණයෝ දෙන්නෙක්ද; ගො, ගුරෙක්ද වීනම්; තිදසයති, තුනකින් හා දසයකින් යතියවීනම්, සා, ඕතොම; පහාසිනී, පහාසිනීනමු

මෙහි "මනාජරාගො" යන තුණකින් යතියය-ඔබ්බේ දසවන "සා" යන්නේ යතියයි.

44 චතුගගහෙහි, සතරකින් හා නවයකින් යතිය වීනම්; ජභා ජගණ භගණයෝ දෙන්නෙක්ද; සජා, සගණ ජගණයෝ දෙන්නෙක්ද; ග්, ගුරෙක්ද වීනම්: ඉහ, මෙහි; රුචිරා, රුචිරා නමු.

මෙහි "හි" යනු පරාදිවත් වනාහෙයින් සතරවන "ෙහ" යන්නේ යතියයි-ඔබ්බේ "ජා" යන නවවන්නෙහි යතියයි. (අතිජගතී)

---

a ටීකායෙහි

රනභසා චන්දවුත්ති-එතෙ ගණා භවන්ති චන්දවුත්ති නාම.

නනමයා පුටොභා-එතෙ ගණා භවන්ති පුටොභා නාම-අට්ඨහි විරාමො ච.

ජසජසා ජලොඩ්ඩතගති වා-එසා ජලොඩ්ඩතගති නාම-ඡහි විරාමො ච.

චතුරෙහි සගවිනීතා-චතුහි රකාරෙහි සගවිනීතා නාම-යදි සත්තහි විරාමො භවති.

නජභ්‍යා නවමාලිනී-එසා නවමාලිනී නාම.

ද්නද්‍රා පමුදිතවදනා සා-නරවයෙහි පමුදිතවදනා-සත්තහි විරාමො භවති.

මභසමා සොදුවිනී සා-එසා සොදුවිනී භවති-චතුහි ඡහි විරාමො.

b ටීකායෙහි

ජභසජගා පසංසිනී සා-එසා පසංසිනී-තීහි විරාමො ච.

මතයසගා මත්තමයූරං-ඉදං මත්තමයූරං නාම.

සජසජගා විජයනන්දිනී-සාදයො භවන්ති විජයනන්දිනී නාම.

මභනයගා භද්දකා-අයං භද්දක නාම-චතුහි යති භවති.

**45 නනරසලහුගා සරෙහිපරාජිතා.**

**46 නනභනලගිතිපහරණකලිකා.**

**47 වුත්තා වසන්තතිලකා තභජා ජගා ගො.**

සක්කරී a

**48 මිහන හසලහුරථගිති සසිකලා.**

**49 වසුහයයතිරිධ මණිගණනිකරො.**

**50 ననමයයයුතායං මාලිනී භොගිසීහි.**

---

45 නනරසලහුගා, නගණ දෙකක්හා රගණ සගණ ලඝු ගුරුහු ඇත්නම්; සරෙහි, සතකින් යතිය වීනම්; අපරාජිතා, අපරාජිතා නමු

46 නනභනලගා, නගණ දෙකක්හා භගණයක්හා නගණ ලඝු ගුරුහු ඇත්නම්; ඉති, මෙසේකල්හි; පහරණකලිකා, පහරණකලිකා නමු·

47 තභජා, තගණ භගණ ජගණයෝ වූනම්; ජගා, ජගණ ගුරුහු වූනම්; ගො, ගුරෙක් වීනම්, වසන්තතිලකා වුත්තා; වසන්තතිලකායයි කියන ලද්දී. (සක්කරී)

48 මිහන, දෙකින්ගණනලද; හයලහු, සත්ලඝුයෙක් වීනම්; (දෙසන–තුදුසයි) අථ, නැවත; ග්, ගුරෙක්වීනම්; ඉති, මෙසේකල්හි; සසිකලා, සසිකලා නමු.

49 වසු හය යති, අටකින්ද සතකින්ද යතිය වීනම්; (ඒ සසිකලාවම) ඉධ, මෙහි; මණිගණනිකරො, මණිගණනිකර නමි.

50 නනමයයයුතා, නගණ දෙකක්හා මගණයක්හා යගණ දෙකකින් යුක්තවූ; අයං, මෝතොම; භොගිසීහි, අටකින්හා සතකින් යතිය වීනම්; මාලිනී, මාලිනී නමු.

---

a ටීකායෙහි

මතනසගගා සම්බාධා–එසා සම්බාධා නාම–පඤ්චහි යති භවති.

රසතභගගා මත්තාසී–සත්තහි විරාමො–චෙ සා මත්තාසී නාම.

රජරජලගා භමරපන්ති සා–අට්ඨහි පදචෙජ්ජෙ–භමරපන්ති නාම.

භජසනගගා විලාසිනී

**51 භවති නජා භජා රසහිතා පභද්දකං.**

අතිසක්කරී a

**52 නජභජරා සදා භවති වාණිනී ගයුතා.**

අට්ඨී b

**53 යමා නො සො භලගා රස හර විරාමා සිඛරිණී.**

**54 රසයුගිසිතො නො සො මරා සලා ගා'ද හරිණී තදා.**

---

51 රසහිතා, රගණයකින් යුක්තාවූ; නජා, නගණ ජගණයෝ දෙන්නෙක් වූනම්; භජා, භගණ ජගණයෝ දෙන්නෙක් වූනම්; **පභද්දකං භවති**, ප්‍රභද්‍රක නම්වේ. (අතිසක්කරී)

52 ගයුතා, ගුරුයුක්තාවූ; නජභජරා, නගණ ජගණ භගණ ජගණ රගණයෝ වූනම්; සදා, හැමකල්හි; වාණිනී **භවති**, වාණිනී වේ. (අට්ඨී)

53 යමා, යගණ මගණයෝ වූනම්; නො, නගණයෙක් වීනම්; සො, සගණයෙක් වීනම්; භලගා, භගණ ලඝු ගුරුහු වූනම්; රස, සයකින්හා; හර, එකොළොසකින්; විරාමා, යතිය හේතුකොට ගෙණ; **සිඛරිණී**, **සිඛරිණී** නමු.

54 යදා, යම්කලෙක්හි; රසයුගිසිතො; සයකින්හා සතරකින් හා සතකින් යතිය වීනම්; නො, නගණයෙක්ද; සො, සගණයෙක්ද; මරා, මගණ රගණයෝද; සලා, සගණ ලඝුහුද; ග්, ගුරෙක්ද වූනම්; තදා, එකල්හි; හරිණී, හරිණී නමු.

---

a ටීකායෙහි

චතුනසා චන්‍දවත්තා—චත්තාරො නකාරාච සකාරොච භවති සා චන්‍දවත්තා.

සාච ඡහි මාලා—සා චන්‍දවත්තා ඡහි විරාමො චෙ මාලා.

මරමථායා කලා යථා—සත්තහි පදච්ඡෙදො චෙ කලා නාම.

නාජභජරාසු කෙසරා—නාදසො කෙසරා නාම.

රජරජසා සක්විනීථා—සත්තහි යති භවති සක්විනී නාම.

b ටීකායෙහි

හරතිනනං උසභගතිවිලසිතා සා—හරෙහි නකාරත්තයෙහි ගෙනච සහිතා සත්තහි වීරාමා චෙ උසභගතිවිලසිතා නාම.

රචතුනගා ලලනා සා—චතුහිවිරාමා ලලනා භවති.

නජභජනගා චන්‍දලෙඛා—එසා චන්‍දලෙඛා නාම.

නජභජරගා චන්‍දිකං—එතං චන්‍දිකං නාම.

ජරජරජගා චිත්තභාගජා—නවහි විස්සරාමා චෙ චිත්තභාගා නාම.

**55 මන්දක්කන්තා මභනතතගා ගො යුගුත්වස්සකෙහි.**

අච්චට්ඨි a

**56 මො තො නො යො යා කුසුමිතලතාවෙල්ලිතාක්ඛුත්විසීහි.**

ධුති b

**57 රසුත්වස්සෙහි ය්මා නසරරගුරූ මෙඝවිප්ඵුජ්ජිතා සා.**
**58 අක්කස්සෙහි යදි ම්සජා සතතගා සද්දූලවික්කීළිතං.**

අතිධුති c

---

55 මභනතතගා, මගණ භගණ නගණ තගණ දෙකක් ඇත්තා වූ ගුරක් යන මොහුවෙද්ද; ගො, ගුරෙක්වේද; යුග, සතරකින්; උතු, සයකින්; අස්සකෙහි, සතකින් යතිය වීනම් මන්දක්කන්තා, මන්දක්කන්තා නමු. (අච්චට්ඨි)

56 මොතො, මගණ තගණයෝ දෙන්නෙක්ද, නො, නගණයෙක්ද; යො, යගණයෙක්ද; යා යගණයෝ දෙන්නෙක්ද වූනම්; අක්ඛුත්විසීහි, පසකින් සයකින් සතකින් යතිය වීනම්; කුසුමිතලතාවෙල්ලිතා, කුසුමිතලතාවෙල්ලිතා නමු. (ධුති)

57 රසුත්වස්සෙහි, සයකින් නැවත සයකින් සතකින් යතිය වීනම්; ය්මා, යගණ මගණයෝද; නසරරගුරූ, නගණ සගණ රගණ දෙකක් ගුරෙක්ද යන මොහු වූනම්; සා, හෝතොම; මෙඝවිප්ඵුජ්ජිතා මෙඝවිප්ඵුජ්ජිතා නමු.

58 යදි, ඉදින්; අක්කස්සෙහි, දොළසකින් සතකින් යතිය වී නම්; ම්සජා, මගණ සගණ ජගණයෝද; සතතගා, සගණ තගණ දෙකක් ගුරෙක්ද යන මොහු වූනම්; සද්දූලවික්කීළිතං, සද්දූලවික්කීළිත නමි. (අතිධුති)

---

a ටීකායෙහි

ජසජසයලගා ධරණී සා–අට්ඨීහි විරාමො ච ජකාරාදයො ධරණී නාම.

භරනභනලගා වංසපත්තපතිතභා–භාදයො වංසපත්තපති–අට්ඨීහි විරාමෙහි.

නජභජජලගා කොකිලානන්තා.
මභනතතගගා මන්දක්කන්තා—චතුහි ඡහි විරාමා මන්දක්කන්තා

b ටීකායෙහි

සනජනභසා කමලා.

c ටීකායෙහි

මසජස තනගා වායුවෙගා–වාදසක්ඛරෙන යති භවති වායුවෙගා නාම.

**59 වුත්තමිදිසනත්තු නාමතො රජා රජා රජා ගුරූ ලහූ ච,**

කති a

**60 මරභනා යො යොත්‍රයෙන තග්මුනි යතියුතා**
**සද්ධරා කිත්තිතායං.**

පකති b

**61 භරා නරනා රනාථච ගුරූද්දසක්කවිරමං පභද්දකමිදං.**

ආකති c

e ඉති වුත්තොදයෙ සමවුත්තපරිච්ඡෙදෙ තතියො.

---

59 රජා, රගණ ජගණයෝද; රජා, නැවත රගණ ජගණයෝද, රජා, රගණ ජගණයෝද; ගුරූ ගුරෙක්ද; ලහුව, ලඝුයෙක්ද විනම්; ඊදිසනත්තු, මෙබඳු වූයේ වනාහි; නාමතො, නමින්; වුත්තං, වෘත්ත නමි. (කති)

60 මරභනා, මගණ රගණ භගණ නගණයෝද; යො, යගණ යෙක්ද; යෙන, යගණයක්හා සමග; යො, යගණයෙක් වීනම්; තිමුනි යතියුතා, තුන සත (එක්විස්සෑක්කත්වූ) යතින්යුක්තවූ; අයං, මෝතො මෝ; අත්‍ර, මෙහි; සද්ධරා කිත්තිතා, සද්ධරායයි කියනලද්. (පකති)

61 භරා, භගණ රගණයෝද; නරනා, නගණ රගණ නගණ යෝද; රනා, රගණ නගණයෝද; අථ, නැවත; ගුරුව, ගුරෙක්ද විනම්; දසක්කවිරමං, දසයකින් දොළසකින් විශ්‍රාමඇති; ඉදංහි, මේවනාහි: භද්දකං, භද්‍රක නමි.

ආකති

තතියො පරිච්ඡෙදෙ.

---

a ටීකායෙහි

මරභනයභලගා සුවදනා–මාදයො භවන්ති සුවදනා නාම.

භරනභරසලගා දෙවවරනා–එතෙ ගණා දෙවවරනා නාම

b ටීකායෙහි

නජභයසපරෙහි ලපොපමා තථා.

c ටීකායෙහි

භතිරනගා මාධුරිකා නයෙන—දසහි විරාමො මාධුරිකා නාම.

e ටීක යෙහි

නතිජභලගෙහි අස්සලලිතොපිනක්කං—නකාර ජභත්තයෙහි ච ලහුගුරූහිච අස්සලලිතං නාම–එකාදසහි.

**1 විසමෙ යදි සා සලගා සමෙ**
**භත්තයතො ගුරුකා උපචිත්තා.**
**2 භත්තයතො යදි ගා දුතමජ්ඣා**
**යදී පුනරෙව භවන්ති නජා ජ්‍යා.**
**3 යදි සත්තිතයං ගුරුයුත්තං**
**වෙගවති යදි භත්තිතයා ගා.**

---

1 විසමෙ, විෂමපාදයෙහි හෙවත් පළමුවන තුන්වන පාදයෙහි; යදි, ඉදින්; සා, සගණයෝ දෙන්නෙක් වූනම්; සලගා, සගණ ලඝු ගුරුහු වූනම්; සමෙ, සමපාදයෙහි; භත්තයතො, භගණතුණකින් පරව; ගුරුකා, ගුරුහු දෙන්නෙක් වූනම්; උපචිත්තා, උපචිත්‍රා නම්.

මේ විරාවෘත්තනම්වේ– මතුදු මෙසේමැයි.

2 යදි, ඉදින්; භත්තයතො; භගණ තුණකින්; ගා, ගුරුහු දෙන්නෙක් වූනම්; යදි, ඉදින්; පුනරෙව, නැවතනම්; නජා, නගණ ජගණයෝ; ජ්‍යා, ජගණ යගණයෝ; භවන්ති, වෙද්ද; (සා, හෝතො ම;) දුතමජ්ඣා, දුතමජ්ඣා නමු.

3 යදි, ඉදින්; ගුරුයුත්තං, ගුරු යුක්තවූ; සත්තිතයං, සගණ තුනක් වෙද්ද; යදි, ඉදින්; භත්තිතයා, භගණතුණකින්; ගා, ගුරු දෙන්නෙක් වූනම්; වෙගවති, වෙගවතී නමු.

---

මමතනනනනලගා මත්තකකීලා–අට්ඨහි පඤ්චහිදසහිච විරාමං භවති මත්තකකීලා. පිකති

භතනසභභනයා තන්වී නාම–ඉමෙ අට්ඨගණෙහි තන්වී පඤ්චසත්ත විරාමා.

මිනඡරා මෙඝමාලා–ම්හි නකාරෙහි ඡහි රකාරෙහි ච රචිතා නව හි යති සා මෙඝමාලා නාම. සඞ්කති

හම්සභචතුනගා කොඤ්චපදා–එතෙ ගණා වෙ තාවිරතියො සියුං සා කොඤ්චපදා නාම.

අභිකති

මමතතිනරසලගා භුජඞ්ගවිජම්භිතා—අඪ්හි සත්තහි එකාදසහිච විරති භවති භුජඞ්ගවිජම්භිතා නාම.

මඤ්නසනගා අපවාහකං– ධවරසරසසර එතෙහි විරාමො භවති තං අපවාහකං. උක්කති

අථ දණ්ඩකා කථියනෙතා.

විහසත්තරෙහි චණ්ඩවුට්ඨිප්පයාතො—නවයෙහි ච සත්තහි රගණෙහි ච චණ්ඩවුට්ඨිප්පයාතො නාම පඨමො දණ්ඩකො.

**4 තො ජො විසමෙ රතො ගුරු චේ**
**මසා ජගා භද්දවිරාජමෙතං ගො චෙ.**

**5 විසමෙ සජා සගුරු යුත්තා**
**කෙතුමතී සමෙ භරනගා ගො.**

**6 ආඛ්‍යානිකා තා විසමෙ ජගා ගො**
**ජතා ජගා ගො තු සමෙථපාදෙ.**

---

4 විසමෙ, විෂමපාදයෙහි; තො, තගණයෙක්ද; ජො, ජගණයෙක්ද; චෙ, ඉදින්; රතො, රගණයක්හුකෙරෙන් පරව; ගුරු, ගුරෙක්ද; (සමෙ, සමපාදයෙහි;) චෙ, ඉදින්; මසා, මගණ සගණයෝද; ජගා, ජගණගුරුහුද වූනම්; ගො, ගුරෙක්වීනම්; එතං, මෙහි; භද්දවිරාජං, භද්දවිරාජ නම්‍.

5 විසමෙ, විෂමපාදයෙහි; සගුරු යුත්තා, සගණ ගුරකින් යුක්තවූ; සජා, සගණ ජගණයෝ වෙද්ද: සමෙ, සමපාදයෙහි; භරනගා, භගණ රගණ නගණ ගුරුහු වූනම්; ගො, ගුරෙක් වීනම්; කෙතුමති, කෙතුමතී නමු.

6 විසමෙ, විෂමපාදයෙහි; තා, තගණයෝ දෙන්නෙක්ද; ජගා, ජගණගුරුහුද; ගො, ගුරෙක්ද; අථ, නැවත; සමෙතු, සමපාදයෙහි වනාහි; ජතා, ජගණ තගණයෝද; ජගා, ජගණගුරුහුද; ගො, ගුරෙක්ද වීනම්; ආඛ්‍යානිකා, ආඛ්‍යානිකා නමු.

---

අණ්ණණ්ණව පලව ව්‍යාල ජීමූත ලීලාකරොද්දාම සීහ සමුද්ද භුජඞ්ගා

සො ච චණ්ඩවුට්ඨිප්පයාතොපරි පාදෙ රාහි වුඩ්ඪියා කමෙන අණ්ණණ්ණවාදයො දස දණ්ඩකා භවන්ති a

තත්‍ථ–අණ්ණස්ස පාදෙ නවයා අට්ඨ රකාරා භවන්ති–අණ්ණවස්ස නව–පලවස්ස දස–ව්‍යාලස්ස එකාදස–ජීමූතස්ස ද්වාදස–ලීලාකරස්ස තයොදස–උද්දාමස්ස චතුද්දස–සීහස්ස පඤ්චදස–සමුද්දස්ස සොළස–භුජඞ්ගස්ස සත්තරස–අට්ඨාරසාදයො තිංසති පරියන්තාවා තතොධිකාවා රකාරා භවන්ති තෙ පචිත්‍යාඛ්‍යා නාම භවන්ති.

ජලද්දයො අපරෙහිපි දණ්ඩකා භවන්ති–තෙ සබ්බත්‍ර නවුත්තා සොදාහරණා ගන්ථලාඝවත්‍ථං.

---

a. වෘත්තරත්නාකරයෙහි මීට වෙනස්වතිබේ.

**7 ජනා ජගා ගො විසමෙ සමෙතු**
**තා ජො ගගා ච විපරීතපුබ්බා.**

**8 සසතො සලගා විසමෙ සමෙ**
**නභභරා භවති හරිණපලුතා.**

**9 යදි නනරලගා නජා ජරා**
**යදිච තදා පරවත්තමිච්චති.**

**10 විසමමුපගතා නනා රයා ච**
**නජජරගා සමකෙච පුප්ඵිතග්ගා.**

**11 වයමිදං වෙතාලියප්පභෙදො.**

**12 සා යවාදිකාමතී රජා රජාතු**
**සමෙසමෙ ජරා ජරා ගුරූ භවෙයුං.**

ඉති අඩ්ඪසමවුත්තපරිච්ඡෙදො චතුත්ථො

---

7 විසමෙතු, විෂමපාදයෙහි වනාහි; ජනා, ජගණ නගණයෝද; ජගා, ජගණ ගුරුහුද; ගො, ගුරෙක්ද වීනම්; සමෙතු, සමපාදයෙහි වනාහි; ච, ඉදින්; තා, තගණයෝ දෙන්නෙක්ද; ජො, ජගණයෙක්ද; ගගා, ගුරුදෙන්නෙක්ද වූනම්; විපරීතපුබ්බා, විපරීත පුබ්බානමු–විපරීතආඛ්‍යානිකායයිසේයි.

8 විසමෙ, විෂමපාදයෙහි; සසතො, සගණ දෙකින් පරව; සලගා, සගණ ලඝු ගුරුහු වූනම්; සමෙ, සමපාදයෙහි; නභභරා, නගණ භගණ භගණ රගණයෝ වූනම්; හරිණපලුතා භවති, හරිණ පලුතා නම්වේ.

9 යදි, ඉදින්; නනරලගා, නගණ නගණ රගණ ලඝු ගුරු (විෂමපාදයෙහි) වේද්ද; යදි, ඉදින්; නජා, නගණ ජගණයෝද; ජරා, ජගණ රගණයෝද (සමයෙහි) වේද්ද; තදා, එකල්හි; පරවත්ත මිච්ඡති, පරවකත්‍රයයි කැමතිවනලදී.

10 ච, ඉදින්; නනා, නගණයෝ දෙන්නෙක්ද; රයා, රගණ යගණයෝ දෙන්නෙක්ද; විසමමුපගතා, විසමයට පැමිණියෝද; සමකෙච, සමපාදයෙහිද; නජජරගා, නගණ ජගණ ජගණ රගණ ගුරුහුද වූනම්; පුප්ඵිතග්ගා, පුප්ඵිතග්ගා නමු.

11 ඉදංවයං, මේපරවකත්‍ර පුෂ්පිතාග්‍ර වෘත්තදෙක; වෙතාලියප්පභෙදො, වෙතාලිය ලක්ෂණ පෙණෙන හෙයින් වෛතාලියප්‍රභෙදයි.

12 අසමෙතු, විෂමපාදයෙහි වනාහි; රජා, රගණ ජගණයෝද; රජා, නැවත රගණ ජගණයෝද වූනම්; සමෙ, සමපාදයෙහි;

1 නට්ඨක්ඛරෙසු පාදෙසු
සනාදිම්හා යොණ්ණවා වත්තං.

2 සමෙසු සින්ධුතො ජෙන
පථ්‍යාවත්තං පකිත්තිතං.

3 ඔජෙසු ජෙන සින්ධුතො
තමෙව විපරීතාදි.

4 නකාරො චෙ ජලධිතො
චපලාවත්තමිච්චෙතං.

5 සමෙ ලො සත්තමො යස්සා
විපුලා පිඞ්ගලස්ස සා.

---

ජරා, ජගණ රගණයෝද; ජරා, නැවත ජගණ රගණයෝද; ගුරූ, ගුරෙක්ද යනමොහු; හවෙය්‍යුං, වෙද්ද; සා, හෝතොම, යවාදිකා මනි, යවමති නම්වා.

## චතුත්ථො පරිච්ඡෙදො

1 අට්ඨක්ඛරෙසු පාදෙසු, අෂ්ටාක්ෂරපාදයෙහි; ආදිම්හා, ආදි වර්ණයා කෙරෙන්; (පරව) සනා න, සගණ නගණයෝ නැද්ද; අණ්ණවා, සතරකින්; (පරව) යො, යගණයෙක් වීනම්; වත්තං, වක්ත්‍ර නමි.

මෙහි "න" යන ආද්‍යක්ෂරයා කෙරෙන් සගණ නගණ නැත– ආදි සතරකුරෙන් පරව "සුපාදෙ"යි යගණයයි.

2 සමෙසු, සමපාදයෙහි: සින්ධුතො, සතරකින්: (පරව) ජෙන, ජගණයක් කාරණකොටගෙණ; පථ්‍යාවත්තං පකිත්තිතං, පථ්‍යා වක්ත්‍රයයි කියනලදී.

3 ඔජෙසු, විෂමපාදයෙහි; සින්ධුතො, සතරකින්; (පරව) ජෙන, ජගණයක් කාරණකොටගෙණ; විපරීතාදි, විපරීතශබ්දයා ආදිකොට ඇති; තමෙව, එම පථ්‍යාවක්ත්‍රමැයි; විපරීතපථ්‍යාවක්ත්‍රයයි සේයි.

4 ජලධිතො, සතරකින්; (පරව) චෙ, ඉදින්; නකාරො, නගණයෙක් (ඔජපාදවයෙහි) වීනම්; ඉති, මෙසේ කළ්හි; එතං, මේ; චපලාවත්තං, චපලාවක්ත්‍ර නමි.

5 යස්සා, යමකගේ; සමෙ, සමපාදයෙහි; සත්තමො, සත්වැනි වූයේ; ලො, ලඝුයෙක් වීනම්; පිඞ්ගලස්ස, පිඞ්ගලමුනිහට; සා, හෝතොම: විපුලා, විපුලානමූ.

මේ හැම විරාවෘත්තයි.

**6 සෙතවස්සාඛිලෙසුපි.**
**7 භෙනණ්ණවා තබ්බිපුලා.**
**8 එවමඤ්ඤා රෙ චතුත්ථා.**
**9 නොණ්ණවා චෙ නවිපුලා.**
**10 තොණ්ණවා තථාඤ්ඤා සියා.**

වත්තප්පභෙදෙ

---

**1 නදිස්සතෙත්ථ යං ඡන්දං**
**පයොගෙ දිස්සතෙ යදි**
**විසමක්ඛරපාදන්තං**
**ගාථා සාමඤ්ඤනාමතො.**

ඉති විසමවුත්තපරිච්ඡෙදො පඤ්චමො.

---

6 සෙතවස්ස, සෙතවමුනිහට; අඛිලෙසුපි, සියලු පාදයෙහිම; (සත්වන ලඝුවීනම්; විපුලා, විපුලාවේ.)

7 අණ්ණවා, සතරකින්; (පරව) භෙන, භගණයක් කරණ කොටගෙණ; තබ්බිපුලා, තබ්බිපුලාවේ; (භවිපුලායි)

8 චතුත්ථා, සතරවැනි අක්ෂරයා කෙරෙන්; (පරව) රෙ, රගණ යෙක් වීනම්; අඤ්ඤා, අන්‍යවූ විපුලා තොම: එවං, මෙසේමැයි. රවිපුලායි)

9 අණ්ණවා, සතරයින්: (පරව) චෙ, ඉදින්; නො, නගණයෙක් වීනම්; නවිපුලා, නවිපුලා නමු.

10 අණ්ණවා, සතරකින්; (පරව) තො, තගණයෙක් වීනම්; තථා, එපරිද්දෙන්; අඤ්ඤසියා, අන්‍යවූ තවිපුලා වේ.

මේ හැම චතුරාවෘත්තයි–හැමයෙහිම වක්ත්‍රලක්ෂණඇති.

වත්තප්පභෙදෙ, වක්ත්‍රප්‍රභෙදයි

---

1 යංඡන්දං, යම් ඡන්දයෙක් නොහොත් ඡන්දශබ්ද සාමාන්‍ය බැවින් යම් වෘත්තජාතියෙක්; එත්ථ, මේවෘත්තොදයෙහි: නදිස්සති, නොදක්නා ලැබේද, යදි, ඉදින්; පයොගෙ, ප්‍රයොගයෙහි, දිස්සතෙ, දක්නාලැබේද; විසමක්ඛරපාදං, විෂමාක්ෂරපාද ඇති; තං, ඒ; සාමඤ්ඤනාමතො, සාමාන්‍යනාමයෙන්; ගාථා, ගාථානම්වේ.

මෙහි ප්‍රසිද්ධ යම් වෘත්තජාතියෙක් ඇත්නම් විශෙෂනාමයෙන් නිර්දිෂ්ටසමයෙහි නොපෙණෙන පරශාස්ත්‍රයෙහි නිර්දිෂ්ටවූ යම් වෘත්ත

**1 a පඤ්චාරෙ සබ්බගෙ පාදෙ පුබ්බගාධොලපරෙ සමා**
**පුබ්බෙ ගරුනෙවමිමෙ කතනබ්බා යාව සබ්බලො.**

**2 නටඨස්ස යො හවෙය්‍යඩෙකා තස්මිං ලොඩිකතෙ සමෙ**
**විසමෙනෙක යගිතෙ හවෙය්‍යඩිකතෙ ගරු.**

---

ජාතියෙක් පිටකත්‍රයෙහි පෙනේනම් සාමාන්‍යනාමයෙන් ගාථා මැයි දතයුතු යනු මෙහි අභිප්‍රායයි.

පඨමො පරිච්ඡෙදො

---

1 පඤ්චාරෙ, ප්‍රස්තාරයෙහි; සබ්බගෙ පාදෙ, සර්වගුරුපාදයෙහි; පුබ්බගා, පූර්වගුරුහු කෙරෙන්; අධො, යට; ල්, ලඝුයෙක්වෙයි; පරෙ, සෙස්සෝ; සමා, සමයෝයි; පුබ්බෙ ගරුති, පූර්වයෙහි ගුරු වන්නේයයි; එවං, මෙසේ; ඉමෙ, මොහු; යාව, යම්තාක්; සබ්බලො, සර්වලඝු පාදයද; (තාව, ඒතාක්;) කතනබ්බා, කටයුත්තාහුයි.

‿ ‿ ‿ ‿ ‿ ‿ මේ ෂඩක්ෂර ඡන්දස සර්වගුරුපාදයයි.

— ‿ ‿ ‿ ‿ ‿ මේ පූර්වගුරින් යට ලඝුව ඇද සෙස්ස සමකල නියායි.

‿ — ‿ ‿ ‿ ‿ මේ පූර්වයෙහි ගුරුකල නියායි.

මෙසේම යම්තාක් සර්වලඝුපාදය දක්නාතෙක් ප්‍රස්තාරකොට ගායත්‍රියෙහි සූසැටවෘත්තයක් දක්වියයුතු–උෂ්ණිහාදියෙහිදු මෙසේ මැයි දතයුතු.

2 නටඨස්ස, නෂ්ටවෘත්තයාගේ; යො අඩෙකා, යම් විභජනයෙක් හවෙය්‍ය, වන්නේද; තස්මිං, ඒ අඩකය; අඩිකතෙ, අඩිකල කල්හි; සමෙ, සමකල්හි; ලො, ලඝුයෙක්වෙයි; විසමෙනු, විෂමකල්හි වනාහි, එකයගිතෙ; එකක් යුක්තකල කල්හි; අඩි කතෙ, අඩිකල කල්හි; ගරුහවෙය්‍ය, ගුරුවන්නේයි.

තමා සිත නැති වෘත්තයක් යමෙක් මෙනම් ඡන්දස පලමුවන වෘත්තය දෙවනවෘත්තය කෙසේදැයි විචාලෝනම් කී සඞ්ඛ්‍යා දෙකක් කොට සමවුව ලඝුවක් ලියනු–විෂමවුව අතින් එකක් ලා දෙකක් කොට ගුරක් ලියනු–මෙසේම කොට ඡන්දස අක්ෂර සඞ්ඛ්‍යාමුළු කොට විචාලෝ පලමුවනවෘත්තය දෙවනවෘත්තය යනාදි කියන්නේය යනු අභිප්‍රායයි.

---

a ටීකායෙහි
පඤ්චාරො නටඨමුද්දිටඨමෙකචාදිලගක්‍රියා.
සඞ්ඛ්‍යා තමඩයොගො ච ඡලෙනෙ පච්චයා මතා.

**3 එකාදිනුක්කමෙනඞ්ක පුබ්බාධො දිගුණෙ ලිඛෙ**
**මිස්සිතෙහි ලඝුවෙඨ්හි සෙකෙහුද්දිට්ඨකමභවෙ.**

**4 වුත්තක්ඛර සමාසඞ්ඛ්‍යාලිඛ්‍ය සෙකොපරූපරි**
**එකෙකගිනමෙකාදිනුට්ඨානෙ සබ්බගාදිකං.**

**5 ගරුක්‍රියඞ්ක සන්දොහෙ [a] භවෙ සඞ්ඛ්‍යාවිමිස්සිතෙ**
**උද්දිට්ඨඞ්ක සමාහාරෙ සෙකො වෙමං සමානයෙ.**

---

3 පුබ්බා, (ලියාගත් වෘත්තයාගේ) පූර්වයා කෙරෙන්; අධො, යට; අඞ්ක, අඞ්කයන්; එකාදිනුක්කමෙන; එකාද්‍යනුක්‍රමයෙන්; දිගුණෙ, දිගුණ වූවන්; ලිඛෙ, ලියන්නේය; මිස්සිතෙහි, මිශ්‍රකරණ ලද; සෙකෙහි, එකක් සහිතවූ; ලඝුවෙඨ්හි, ලඝුස්ථයන් කරණ කොටගෙණ; උද්දිට්ඨකමභවෙ, උද්දිෂ්ඨක වන්නේයි.

යම් කෙනෙක් යම් වෘත්තයක්හුගේ ලඝු ගුරු ස්ථිතිය කියා මෙසේවූ වෘත්තය ප්‍රස්තාරයෙහි කීවනදැයි විචාලෝනම් විචාලවෘත්ත යෙහි ගුරුලඝු කිපරිද්දෙන් තබාගෙණ පූර්වගුරුහු හෝ ලඝුහු හෝ කෙරෙහි පටන් යට එකෙකයනාදින් විගුණකොට ලියා ලඝුන් යටසිටි සඞ්ඛ්‍යා එක්කොට අතින් එකක් ලා ඒ සඞ්ඛ්‍යාපමණින් විචාල වෘත්තය කියන්නේය යනු මෙහි අභිප්‍රායයි.

4 වුත්තක්ඛර, වෘත්තයාගේ අක්ෂරයන්හා; සමා, සමවූ; සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යාවෙන්, සෙකා, එකක් සහිත වූවවුන්; උපරූපරි, මතුමත්තෙහි; ආලිඛ්‍ය, ලියා; එකෙකගිනං, එකක් එකක් ගිනකොට; එකාදිනං උට්ඨානෙ, එකාදින්ගේ උට්ඨානය කළකල්හි; සබ්බගාදිකං, සර්ව ගුරුපාද්‍යදිය වේ.

මෙනම් ඡන්දස සර්වගුරුවෘත්ත කීයෙක්ද විගුරුවෘත්ත කීයෙක්ද යනාදින් විචාළකල ඒ ඡන්දස අක්ෂරහා සමවූ සඞ්ඛ්‍යාවෙන් එකක් සහිතකොට මතුමත්තෙහි මෙසේ ලියයුතු-මේ ගායත්‍රියටයි- එකක් මත්තෙන් හැර එකාදින්ගේ උට්ඨානය මෙසේ කටයුතු- මෙසේ කොට කෙළවර එකෙක සයෙක යනාදි සඞ්ඛ්‍යාවූ නියාවට සර්වගුරුවෘත්ත එකෙක විගුරුවෘත්ත සයෙක යනාදින් කියයුතු.

5 ගරුක්‍රියා, ගුරුක්‍රියාවගේ; අඞ්කසන්දොහෙ, විහණ සමූහය; විමිස්සිතෙ; මිශ්‍රකළකල්හි; සඞ්ඛ්‍යා භවෙ, ඒඒ ඡන්දස් ප්‍රස්තාරයෙන් නැගී වෘත්තසඞ්ඛ්‍යාවන්නේයි.

(යට කී ගුරුක්‍රියායෙහි කොට තුබූ ගුරුක්‍රියාවගේ කෙළවර සිටි එකය සයය පසළොසය විස්සය පසළොසය සයය එකය යන මේ සඞ්ඛ්‍යාවන් එක්කොට පිඩුකළකල ඒ ඡන්දස මෙවිතර වෘත්ත සඞ්ඛ්‍යාවෙයි යනු මෙහි අභිප්‍රායයි)

සෙකො, එකක් සහිතවූ; උද්දිට්ඨඞ්කසමාහාරො වා, යටකී උද්දිෂ්ටයෙහි විහණයන්ගේ එක්කිරීමහෝ; ඉමං, මේ වෘත්තසඞ්ඛ්‍යාව; සමානයෙ, එලවන්නේය.

---

[a] මේ මෙසේම පොත්හි පෙනේ "ලගක්‍රියාඞ්කසන්දොහෙ" යි උචිතපාඨයයි සලකමු.

**6 සංඛ්‍යාව ද්විගුණෙකූනා විත්ථාරායාම සම්භවො**
**වුත්තස්සඩ්ඪන්තරානඤ්ච ගරුලානඤ්ච අඞ්ගුලං**

ඉති සඞ්ඝරක්ඛිතථෙරපාදවිරචිතෙ වුත්තොදයෙ ඡන්දසි
ඡප්පච්චයවිභාගො නාම ඡට්ඨො පරිච්ඡෙදො.

---

1 සෙලන්තරායතනවාසිකසීලථෙර
පාදෙ ගුරූගුණගුරූ ජයතම්මමෙසො,
යස්සප්පභාවමවලම්බමයෙදිසො පි
සම්පාදිතොභිමතසිද්ධිකරො පරත්ථො.

2 පරත්ථසම්පාදනතො පුඤ්ඤෙනාධිගතෙනහං
පරත්ථසම්පාදනකො භවෙය්‍යං ජාතිජාතියං.

3 අවලොකිතමත්තෙන යථා ඡප්පච්චයා මයා
සාධිතා සාධයන්තෙවමිච්ඡිතත්ථම්පි පාණිනො.

4 යෙනාතතනන්තරතනාකරමන්ථනෙන
මන්ථාචලොල්ලසිතඤාණවරෙන ලද්ධා,
සාරාමතාතිසුඛිතා සුඛයන්ති චඤ්ඤෙ
තෙ මෙ ජයන්ති ගුරවො ගුරවො ගුණෙහි.

5 පුඤ්ඤෙන තෙන ජිනපත්ති යදා භවෙය්‍ය
තාවාහ සාරිතනුජො වසතිමතීමා,
තෙජොනිහෙතු පටිසඞ්ඛි අමොඝරූපි
ලද්ධාධිතිබලපසත්ථගුණො භවෙය්‍යං.

වුත්තොදයං නිට්ඨිතං.

සිද්ධිරත්ථු.

---

6 ද්විගුණ, දෙගුණවූ; ඒකූනා, එකක් ඌනකොටඇති, සංඛ්‍යාව, (වෘත්තයාගේ අක්ෂරපරිමාණයෙන් තබන ගුරුලඝු විභාගයන්ගේ) එක්කිරීමහෝ; වුත්තස්ස, වෘත්තයාගේ; විත්ථාරායාම සම්භවො, විස්තරයෙන්ද ආයාමයෙන්ද සම්භවය ඇති; අඩ්ඪ, අඩවප්‍රදේශය වේයි; අන්තරානඤ්ච, ගුරුලඝුන්ගේ අන්තරයන්ටද; ගරුලානඤ්ච, ගුරුලඝුන්ටද; අඞ්ගුලං, අඟුලක්පමණ වන්නේයි.


මධ්‍යානම්වූ ත්‍ර්‍යක්ෂරඡන්දසගේ සමවෘත්තසඞ්ඛ්‍යාව අටකි–අට දිගුණුකල කල සොළසෙක්වේ–සොළසින් එකක් හැර ඡන්දසගේ ප්‍රස්තාරයට පලලින් පසළොස් අඟුලක් පමණ භූමියක් උවමනාවැයි දතයුතු.

ප්‍රස්තාරයට භූමියගේ ආයාමය අක්ෂරසඞ්ඛ්‍යායෙහි දතයුතුයි–කෙසේද? මධ්‍යාවගේ සතරපාදයම අක්ෂර දොළසෙකි—දොළස දිගුණුකල කල්හි සූවිසි අඟුලෙකි–ඉන් එක්අඟුලක් හැර තෙවිසි අඟුලක් පමණ ආයාමයක් වියයුතු–මේ මෙහි අභිප්‍රායයි.

ඡට්ඨො පරිච්ඡෙදො

සමාප්තයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු